# කාර්යසාධන වාර්තාව

# අධිකරණ අමාත්‍යාංශය

**2015- ජනවාරි සිට දෙසැම්බර් දක්වා**


අධිකරණ අමාත්‍යාංශය

උපරිමාධිකරණ සංකීර්ණය

කොළඹ 12.

**www. justiceministry.gov.lk**

**ගරු අධිකරණ අමාත්‍යතුමා**
**ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා**

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා**
**නීතිඥ සාරතී දුෂ්මන්ත මහතා**

**අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා**
**පද්මසිරි ජයමාන්න මහතා**

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | අධිකරණ අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 03 |
| 2. | අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් | 04 |
| 3. | අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන | 05 |
| 4. | අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් සංක්ෂිප්තව | 07 |
| 5. | අධිකරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්ගේ ප්‍රගතිය | |
| 5.1 | නීති අංශය | 08 |
| 5.2 | පාලන හා ආයතන අංශය | 16 |
| 5.3 | ගිණුම් අංශය | 19 |
| 5.4 | යටිතල පහසුකම් අංශය | 20 |
| 5.5 | සංවර්ධන අංශය | 24 |
| 5.6 | සැලසුම් අංශය | 24 |
| 5.7 | අභ්‍යන්තර විගණන අංශය | 25 |
| 6. | අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන | |
| 6.1 | නීතිපති දෙපාර්තමේන්තුව | 26 |
| 6.2 | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව | 28 |
| 6.3 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 31 |
| 6.4 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 33 |
| 6.5 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | 35 |
| 6.6 | ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | 39 |
| 6.7 | නීති ආධාර කොමිෂන් සභාව | 41 |
| 6.8 | සමථ මණ්ඩල කොමිෂන් සභාව | 43 |
| 6.9 | කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | 47 |
| 6.10 | අධිකරණ නොවන නිලධාරීන් සඳහා පුහුණු ආයතනය | 49 |
| 6.11 | උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය | 50 |
| 7. | අධිකරණ | |
| 7.1 | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය | 52 |
| 7.2 | අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය | 54 |
| 7.3 | කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි | 55 |
| 8. | අනෙකුත් ආයතන | |
| 8.1 | ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය | 57 |
| 8.2 | නීති විද්‍යාලය | 59 |

# අධිකරණ අමාත්‍යාංශය

## දැක්ම

- යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රමයක්
- ගෝලීය උන්නතීන්ට හා ජනතා අපේක්ෂාවන්ට සරිලන පරිදි සමාජීය අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## මෙහෙවර


- කාර්යක්ෂම හා අර්ථවත් ලෙස යුක්තිය පසිඳලීමේ අරමුණ ඇතිව ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;
- පුරවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් පිළිගැනීම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## 02. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන්


- යුක්තිය පසිඳලීම, පරිපාලනය කිරීමේ යාන්ත්‍රණයට අදාලවන ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම,පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වෙනත් කිසිදු ආයතනයක් වෙත පවරා දෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු
- සමාජ අවශ්‍යතාවන් සහ ගෝලීය ප්‍රවණතාවන් සැලකිල්ලට ගෙන නීති පද්ධතියට අවශ්‍ය කරනු ලබන ප්‍රතිසංස්කරණ සිදුකිරීම.
- උසාවි පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් වැළැක්වීම ඇතුලුව සමස්ත පරිපාලනයට අදාළ සියලු කටයුතු ක්‍රමවත්ව කාර්යක්ෂමව ඉටුකිරීම.
- රජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කටයුතු.
- රජයට සහ සියලුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම.
- නීති කෙටුම්පත් කිරීම.
- යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාවදීම, එම දඬුවම් අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
- සමස්ත ක්වාසි පද්ධතියේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කම්කරු විනිශ්චය සභා පරිපාලනයට සහ ඊට අදාළ අනෙකුත් කටයුතු
- නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම.
- නීති ශබ්ද මාලා පිළියෙල කිරීම
- ශ්‍රී ලංකා නිති වර්තා පලකිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / ආයතන අධීක්ෂණය සහ එම ආයතනවලට පැවරි ඇති අනෙකුත් සියලුම විෂයයන්

## 03. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන

### අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු



# අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන



## 04. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් සංක්ෂිප්තව

- අමාත්‍යාංශයේ කාර්යයන් පහත අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබයි. එනම්,

  i. නීති අංශය
  ii. පාලන අංශය
  iii. ගිණුම් අංශය
  iv. යටිතල පහසුකම් අංශය
  v. සංවර්ධන අංශය
  vi. සැලසුම් අංශය
  vii. අභ්‍යන්තර විගණන අංශය

**i.** නීති අංශය

යුක්තිය පසිඳලීමට අදාළ නීති සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම, නීති වාර්තා පලකිරීම, නීති ආධාර ලබා දීම, අපරාධ, සිවිල් සහ වාණිජ කරුණු සම්බන්ධයෙන් සහ අන්තර්ජාතික ළමා අපහරණය පිළිබඳ සිවිල් පැතිකඩයන් සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහයෝගීතාවය ලබා දීම සඳහා මධ්‍යම බලධාරියා වශයෙන් කටයුතු කිරීම, 1995 අංක 05 දරණ පනත යටතේ සිරකරුවන් මාරුකිරීම, ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාරක සභා පැවැත්වීම, සිරකරුවන්ට සමාව ප්‍රදානය කිරීම පිළිබඳ නිර්දේශයන් ලබා දීමත් නීති අංශය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

**ii.** පාලන අංශය

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛනගත රාජ්‍ය නිලධාරීන් හැර අනිකුත් සියලුම නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල පරිපාලන කටයුතු කිරීම.

**iii.** ගිණුම් අංශය

අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල මූල්‍ය සැලසුම් කළමනාකරණය සහ පාලනය.

**iv.** යටිතල පහසුකම් අංශය

අධිකරණ ගොඩනැගිලි, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස සහ කම්කරු විනිශ්චය සභා සහ කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම, වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම.

**v.** සංවර්ධන අංශය

සංවර්ධන අංශය මගින් අධිකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි සංවර්ධන කාර්යයන් ඉටු කිරිම හා සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

**vi.** සැලසුම් අංශය

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල කටයුතු පිළිබඳ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, ප්‍රගති පාලනය සහ සුපරීක්ෂණය.

**vii.** අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල ගිණුම් විගණනය.

## 05. අධිකරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්හි ප්‍රගතිය

### 5.1 <u>නීති අංශය</u>

මෙම වසරේ 2015.12.31 වන විට නීති අංශය මගින් නව පනත් කෙටුම්පත් හා පනත් (සංශෝධන) සම්මත කිරිමේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

1. ළමා ආරක්ෂක පනත් කෙටුම්පත
   මෙම පනත් කෙටුම්පත මගින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් වර්තමානයට ගැලපෙන පරිදි ප්‍රතිපාදන සැළසීමට මෙන්ම යල්පැනගිය ළමා හා තරුණ පුද්ගලයින් සම්බන්ධ ආඥා පනත ඉවත් කිරීමට අපේක්ෂා කරයි. මේ මගින් අධිකරණය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, පරිවාස දෙපාර්තමේන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුව අතර සහයෝගීතාවය වැඩි කිරීමට බලාපොරොත්තු වන අතර ළමයාගේ, ගරු නීතිපතිතුමාගේ, නියෝජිතයන්ගේ යෝජනා ඇතුලත් කෙටුම්පත ලැබි ඇති අතර නුදුරේදිම තවදුරටත් යෝජනා සාකච්ඡා කිරීමට නියමිතය.

2. කාලාවරෝධී විශේෂ විධිවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
   1983 -2009 කාලය තුළ අවතැන්වූ හා අසාධාරණයට ලක්වූ දේපල හිමිකරුවන්ට කාලාවරෝධී ආඥා පනතේ ප්‍රතිපාදන මඟින් සහනයක් ලබාදීමේ අපේක්ෂාවෙන් මෙම සංශෝධනය ඉදිරිපත් කර ඇත. මෙම පනත 2016 අප්‍රේල් 06 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත කරන ලදි.

3. අශ්ශීල ප්‍රකාශන පනත් කෙටුම්පත
   පරිගණක අපරාධ පනතෙහි පරිගණක ආධාරයෙන් සිදු කරන ළමයින් පිළිබඳ අසභ්‍ය දර්ශනවලට අදාළ වගන්තියක් ඉවත්කර මෙම නව පනතට ඇතුළත් කර ඇත. මෙම පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කලවිට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයේ නිරීක්ෂණ ලබා ගැනිමට තිරණය කරන ලදී.

4. අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
   2013 අංක 02 දරණ මෙම පනත මඟින් නිශ්චිතව සඳහන් අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන රඳවා ගැනීමේ කාලය දීර්ඝ කිරීම සඳහා ප්‍රතිපාදන සලසන අතර නැවත අදාල කාලය දීර්ඝ කිරීමේ නියෝගය 2015. 03.19 දින පාර්ලිමේන්තුවේදි සම්මත කරන ලදී.

5. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය
   ජාතික මානව හිමිකම් ක්‍රියාකාරි සැලැස්ම මගින් සිදු කල නිර්දේශයන් ඇතුළත් කරමින් මෙම පනත් කෙටුම්පත සකස් කර ඇත.

6. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභා (සංශෝධිත) පනත් කෙටුම්පත
   ජාතික මානව හිමිකම් ක්‍රියාකාරි සැළැස්ම මගින් සිදුකළ නිර්දේශයන් සැළකිල්ලට ගනිමින් මෙම පනත් කෙටුම්පත සකස් කර ඇත. මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමද පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර ඇත. මේ වන විට පනත් කෙටුම්පත් දෙකම ඒකාබද්ධ කර නිරීක්ෂණ සඳහා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

7. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් වෙත සහාය හා ආරක්ෂාව සැලැස්වීමේ පනත් කෙටුම්පත
මෙම පනත මගින් අපරාධ වින්දිතයින් හා සාක්ෂිකරුවන් වෙත සහය හා ආරක්ෂාව සැලැසීමේ ප්‍රතිපාදන සපයයි. මෙම පනත 2015 අංක 04 ලෙස පාර්ලිමේන්තුවේ සම්මත කරන ලදී.

8. නොතාරිස් ආඥා පනත (සංශෝධන) පනත් කෙටුම්පත
වංචා සහගත ඉඩම් ගනු - දෙනු සිදුවෙමින් පවතින නිසා නොතාරිස් ආඥා පනත සංශෝධනයට යොමු කර ඇත. මෙහිදී ඔප්පුවට අත්සන් තබන අවස්ථාවේදී ජීවමිතික අත්සන් උපයෝගී කර ගැනීම හා වංචා වැළැක්වීම සඳහා ප්‍රතිපාදන අන්තර්ගත කර ඇත. පනත් කෙටුම්පත ව්‍යවස්ථාකරණය පිළිබඳ අමාත්‍ය අනුකාරක සභාව විසින් අනුමත කිරීමෙන් පසු විෂයයේ වගකීම දරණ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

9. මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත
ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කරන ලද කමිටුව මගින් මුස්ලිම් විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත පිළිබඳ සාකච්ඡා කරමින් පවතින අතර පනත් කෙටුම්පත සකස් කරමින් පවතී.

10. බන්ධනාගාර පරිපාලන පනත් කෙටුම්පත
මෙම පනත මගින් බන්ධනාගාර සිරකරුවන් පරිපාලනය කිරීමට අවශ්‍ය නව පාලන ක්‍රමයක් සඳහා විධිවිධාන සලස්වනු ලබයි. බන්ධනාගාර අධිකාරිය විසින් යෝජනා කළ අවශ්‍ය සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇත. මුදල් අමාත්‍යාංශය යෝජනා කළ අවශ්‍ය සංශෝධනද පනත් කෙටුම්පතට ඇතුලත් කර ඇත. මේවන විට මෙය බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන බැවින් එම අමාත්‍යාංශයට යොමුකර ඇත.

11. සිවිල් නඩු කටයුතුවලදී දෙමව්පියභාවය පරීක්ෂා කිරීමේ පනත් කෙටුම්පත
මෙම පනත් කෙටුම්පත මගින් මාතෘත්වය හා පිතෘත්වය හඳුනා ගැනීමට ජාන පරීක්ෂණය (ඩී.එන්.ඒ) සිදුකිරීම සඳහා විධිවිධාන සැලසේ. මෙම කෙටුම්පත ළමයින්ගේ භාරකාරත්වය, නඩත්තු සහ උරුමකාරත්වය වැනි කරුණු සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන සලසයි. පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරිමෙන් පසු ප්‍රමාද කරඇත.

12. සිවිල් නඩු විධිවිධාන සංග්‍රහය ( පූර්ව නඩු විභාග /නඩු කටයුතු ) පනත් කෙටුම්පත
මෙය නඩු කටයුතු ප්‍රමාදය අවම කිරීම සඳහා කෙටුම්පත් කර ඇත. පනත් කෙටුම්පත ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාරක සභාව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ පනත් කෙටුම්පතට ඇතුලත් කර ඇත. අවසන් කෙටුම්පත නිති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇත.

13. විදේශිය නඩු තීන්දු ක්‍රියාත්මක කිරීම
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව මගින් යොමුකරන ලද පනත් කෙටුම්පත සලකා බලමින් පවතී.

14. අධිකරණයට අපහාස කිරීමේ පනත් කෙටුම්පත.
පනත් කෙටුම්පත සලකා බලමින් පවතී.

**15.** ඇටෝර්නි බලපත් (සංශෝධන) පනත් කෙටුම්පත.

වංචා වැළැක්වීම සඳහා මෙම අඥා පනත සංශෝධනය කරනු ලබයි. කමිටුව විසින් පනත් කෙටුම්පත අවසන් කර ගරු අධිකරණ අමාත්‍යතුමාට භාරදෙන ලදී.

**16.** අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

උපලේඛනයට නිශ්චිත දැක්වෙන වැරදි ඇතුළත් කරමින් කෙටුම්පතක් සකස් කර ඇත. පනත් කෙටුම්පත ගරු නිතිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත.

**17.** අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත් කෙටුම්පත

නඩු භාණ්ඩ ඉවත් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම පිණිස මෙම සංශෝධනයේ කෙටුම්පතක් සකස් කර ඇත. මෙය **2015.12.03** වෙනි දින ගරුනිතිපතිතුමාගේ නිරික්ෂණ සඳහා ඉදිරිපත් කර ඇත

**18.** අයාල ආඥා පනත (සංශෝධන) පනත් කෙටුම්පත

පනත් කෙටුම්පත සකස්කර එම පනත අයත් වන සමාජ සේවා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

**19.** සුරාබදු අඥාපනත

සුරාබදු අඥාපනත යටතේ පොලීසියටද ක්‍රියා කිරීමට බලය ලබාදිම පිණිස සුරාබදු අඥාපනතට සංශෝධන සකස්කර ඇත. මේ සම්බන්ධ තවත් සංශෝධනයක් අදාල අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් සම්පාදකට ඉදිරිපත් කර ඇත.

**20.** ආගමික, ජාතිවාදී හෝ ජනවාර්ගික අසමගිය හෝ එදිරිවාදිකම ප්‍රකෝප කර හැණීම්වලට පෙළඹවීම අපරාධයක් වන බවට විධිවිධාන සැලසීම පිණිස දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම. පාර්ලිමේන්තුවේ විරෝධතාවය මත පනත්කෙටුම්පත ඉවත්කර ගැනිමට සිදුවී ඇත.

**21.** ත්‍රස්තවාදය වැළක්වීමේ පනත (තාවකාලික විධිවිධාන) අහෝසි කිරීම

කෙටුම්පතක් ඉදිරිපත් කර ඇත. එය විෂයේ වගකිම දරණ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට යොමුකර ඇත.

**22.** ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳව පනත් කෙටුම්පත

මෙම පනත් කෙටුම්පත පිළිබඳව නීති කොමිසන් සභාව විසින් සලකා බලමින් පවතී.

**23.** බෙදුම් පනතට යෝජිත සංශෝධනය

පරවේණි නිළකාරයාට බෙදුම් නඩුවක් හෝ "පංගුව" හෝ පංගුවට අයත් ඕනෑම ඉඩමක් සම්බන්ධයෙන් නඩුකරයක් ගෙනඒමට හැකි පරිදි බෙදුම් පනත සංශෝධනය කිරිම. මෙය විභාගවෙමින් පවතින සියලුම නඩු ආවරණය වන ලෙස අතීතයට බලපාන පරිදි සංශෝධනය කිරිමට නියමිතය. පනත් කෙටුම්පත ගරු නිතිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත.

**24.** අවලංගු කල නොහැකි තෑගි ඔප්පු අවලංගු කිරීම පිළිබඳ (විශේෂ විධිවිධාන ) පනත

නිසි බලය සහිත අධිකරණයක් විසින් නිකුත් කරණ නියෝගයක් මගින් පමණක් අවලංගු කල නොහැකි තෑගි ඔප්පු අවලංගු කිරීම සඳහා මෙම පනත් කෙටුම්පත මගින් විධිවිධාන සලසනු ලැබේ. මෙම පනත් කෙටුම්පත **2015** නොවැම්බර් **04** වන දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත, මෙම කෙටුම්පත **2015** නොවැම්බර් **24** වන දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යවන ලදී.

## අනෙකුත් කටයුතු

- **ශ්‍රී ලංකා නීති වාර්තා පලකිරීම**

ශ්‍රී ලංකා නිති වාර්තා පලකිරීම නීති අංශය මඟින් සිදු කරයි. ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය විසින් ලබාදුන් ඉතා වැදගත් නඩු තීන්දු ඇතුලත් කරමින් සෑම වසරකම වෙළුම් දෙකක් මුද්‍රණය කරනු ලබයි.

- **2001 අංක 10 දරණ ජාත්‍යන්තර ළමා අපහරණ පනත**

2001 අංක 10 දරණ පනත යටතේ, ළමා අපහරණය පිළිබඳ අයදුම්පත් 52ක් ලැබී ඇත. ඉන් බොහෝමයක්ම නඩු පැවරීමකින් තොරව සමථයකට පත් විය. දැනට මෙම පනත යටතේ මහාධිකරණයේ නඩු දෙකක් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ තවත් නඩුවක් විභාග වෙමින් පවතී. සිය කැමැත්තෙන් ආපසු ඒමට කැමති බව සලකා බැලීමට ජපානයෙන් අයදුම්පතක් ලැබී තිබේ.

- **වරදකරුවන් මාරුකිරීම**

ශ්‍රී ලංකාව තුළදී වරදක් කර වැරදිකරුවෙකු බවට පත්වූ වෙනත් රටක පුරවැසියෙකු එරටට භාර දීම සහ වෙනත් රටකදී වරදකරුවකු වූ ශ්‍රී ලාංකික පුරවැසියෙකු ශ්‍රී ලංකාවට භාර දීම සම්බන්ධයෙන් 1995 අංක 5 දරණ මෙම පනත ක්‍රියාත්මක වේ. ඒ අනුව ඉන්දීය වරදකරුවන් 23 දෙනෙකු, පකිස්තානු වරදකරුවන් 50 දෙනෙකු සහ මාලදිවයින් වරදකරුවෙකු එම රටවලට භාරදී ඇත. එක්සත් රාජධානිය තුළ වරදකරුවන් වූ ශ්‍රී ලාංකිකයන් 02 දෙනෙකු ඔහුගේ සිර දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා මෙම පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවට භාර දී ඇත. මාලදිවයිනේ සිටින ශ්‍රී ලාංකික සිරකරුවන් 10 දෙනෙකු නුදුරේදීම රැගෙන ඒම පිළිබඳ සාකච්ඡා කරමින් පවතී.

ශ්‍රී ලංකා රජය සහ වියට්නාම් රජය අතරද සිරකරුවන් මාරු කිරීමේ ගිවිසුමක් අත්සන් කරන ලදී. එසේම රුසියාව සමඟ ද වරදකරුවන් මාරුකිරීමේ ගිවිසුමක් ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් 2015 මැයි 28 වන දින අත්සන් කරන ලදී. යුක්රේන් රජය සමඟ ද ගිවිසුම සකස් කිරීමේ අවසන් කටයුතු සඳහා නුදුරේදීම සාකච්ඡා පැවත්වීමට නියමිතය.

- **ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය පිහිටුවීම.**

ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය පිහිටුවන බව 2011 දෙසැම්බර් මාසයේ දී අධිකරණ අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කරන ලදි. මෙම මධ්‍යස්ථානය මගින් යම් වානිජ ආරවුල් විසඳීම සඳහා අන්තර්ජාතික සමාගම් වෙත අවස්ථා උදා කරනු ඇත. ශ්‍රී ලංකාව, මෙම කලාපයේ පිහිටි ජාත්‍යන්තර බේරුකරණ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම රජයේ ද අපේක්ෂාවයි. මෙම ව්‍යාපෘතිය සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් මූලික වශයෙන් රුපියල් මිලියන 100 ක මුදලක් ආයෝජනය කර ඇත. ලෝක වෙළඳ මධ්‍යස්ථානය ව්‍යාපාරික කේන්ද්‍රස්ථානයක් මධ්‍යයේ පිහිටා තිබීමත් තරු පන්තියේ හෝටල සහ ආපනශාලා මෙන්ම සංචාරක ආකර්ශනීය ස්ථාන වලට ඉතා සමීප වීමත්, ජාත්‍යන්තර බේරුම්කරණය සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් වලට ආසන්න වීමත් නිසා මෙම බේරුම්කරණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 22 වන මහළ තෝරාගන්නා ලදී.

මෙම මධ්‍යස්ථානය 2015 මාර්තු මාසයේ විවෘත කරනලදී. මෙය පවත්වාගෙන යාම සඳහා සමාගමක් ස්ථාපිත කරගැනීම පිණිස අවශ්‍ය පියවර ගෙන ඇත. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අවසන් වශයෙන් සකස් කෙරෙමින් පවති. බේරුම්කරණ කටයුතු සහ බේරුම්කරණය පිළිබදව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, බේරුම්කරුවන් පුහුණු කිරීම වැනි බේරුම්කරණය ආශ්‍රිත අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා ද බේරුම්කරණ මධ්‍යස්ථානය මේ වනවිට විවෘතව ඇත.

- **විදේශ ගතව සිටින විත්තිකරුවන්ට ශ්‍රී ලංකාවේ උසාවිවලින් නිකුත් කරන සිතාසි භාර දීමේ සේවාව පිළිබඳ කරුණු**

**2000** අංක **39** දරණ සිවිල් හා වාණිජ කරුණු වලදී අනෝන්‍ය සහයෝගය පිළිබඳ පනතට අනුව **2015** ජනවාරි **01** සිට දෙසැම්බර්**31** දක්වා කාලයට අදාලව ශ්‍රී ලංකාවේ උසාවි වලින් නිකුත් කරන ලද සිතාසි **399**ක් පහත දක්වා ඇති පරිදි විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විවිධ උසාවි වලට භාරදී ඇත.

| රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව | රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව |
|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව | 22 | මලයාසියාව | 06 |
| බහරේන් | 04 | මාලදිවයින | 03 |
| බංගලිදේශය | 01 | මෝල්ටාව | 03 |
| කැනඩාව | 23 | මුරිසිය | 03 |
| චීනය | 05 | නෙදර්ලන්තය | 01 |
| සයිප්‍රසය | 04 | නවසීලන්තය | 01 |
| ඩෙන්මාර්ක් | 01 | නෝර්වේ | 03 |
| දෝහ කටාර් | 22 | ඕමානය | 01 |
| පින්ලන්තය | 01 | පකිස්ථානය | 03 |
| ප්‍රංශය | 16 | පිලිපිනය | 02 |
| ජර්මනිය | 09 | රුසියාව | 04 |
| ඉන්දියාව | 14 | සිෂෙල්ස් | 02 |
| ඉන්දුනිසියාව | 02 | සිංග්ප්පූරුව | 08 |
| අයර්ලන්තය | 01 | ස්පාඤ්ඤය | 02 |
| ඊශ්‍රාලය | 10 | ස්විඩනය | 04 |
| ඉතාලිය | 59 | ස්විස්ටර්ලන්තය | 04 |
| ජපානය | 06 | එක්සත් ආරාබි එමිර් රාජ්‍ය | 22 |
| ජොර්දානය | 06 | එක්සත් රාජධානිය | 54 |
| කොරියාව | 09 | ඇමෙරිකා එක්සත් ජනපදය | 21 |
| සවුදි අරාබිය | 25 | වියට්නාමය | 01 |
| කුවේට්ය | 11 | | |

- **අපරාධ කරුණු සම්බන්ධයෙන් අනොන්‍ය නීති උපකාර ගිවිසුම්**

අපරාධ කරුණු සම්බන්ධයෙන් අනොන්‍ය නීති උපකාර කිරීමේ ගිවිසුමක් ශ්‍රීලංකා රජය හා බෙලරුස් රජය අත්සන් කර ඇත. විමර්ශනය, චෝදනා ඉදිරිපත් කිරීම, නඩු විභාග කිරීම සහ එහි ප්‍රතිඵලය ලෙස ඇති වන නීති කෘත්‍යයන් ඇතුළු සාපරාධි කාරණා වලදී එක් එක් පාර්ශවය වෙත අනොන්‍ය නෛතික සහයෝගිතාව ලබා දීමේ අපේක්ෂාවෙන් බෙලරුස් ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මෙම අවබෝධතා ගිවිසුමට එළඹ ඇත. ශ්‍රී ලංකාවට මෙන්ම බෙලරුස් රාජ්‍යයට ද ප්‍රතිලාභ අත්කර දෙන ආකාරයෙන් සහ මෙම රාජ්‍යයන්වල නීති සහ රාජ්‍යයන් දෙක විසින් පිළිගෙන ඇති හෝ අත්සන් කර ඇති ජාත්‍යන්තර ගිවිසුම් වලට අනුකූල වන ආකාරයෙන්, දෙරටෙහි නීතිමය පද්ධතිය, ආයතන සහ ව්‍යවස්ථා සංවර්ධනය කිරීම ආශ්‍රිතව පවත්නා ගැටළු සම්බන්ධයෙන් නෛතික රාමුවක ස්වරූපයක් ගන්නා සහයෝගීතාවක් ඇති කිරීමට ක්‍රියා කිරීම ශ්‍රී ලංකාවේ රජය හා බෙලරුස් රජය අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුමේ පරමාර්ථය වේ.

ශ්‍රී ලංකා රජය විසින් 2014 වර්ෂය තුළ චීනය, බෙලරුස්, සහ එක්සත් අරාබි එමීර් රාජ්‍ය සමඟ අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නීති උපකාර කිරීමේ ගිවිසුම් වලට එළඹ ඇත. මීට අමතරව රුසියාව සමග අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නීති උපකාර හා සිරකරුවන් හුවමාරුව සම්බන්ධයෙන් ගිවිසුමක් ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් 2015 මැයි 28 වන දින අත්සන් කරන ලදී.

- <u>එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) - නීතිය බලාත්මක කිරීම යුක්තියට ප්‍රවේශ වීම සහ සමාජ ඒකාබද්ධතාව සවිමත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය</u>

2014 පෙබරවාරි මස සිය කටයුතු ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මූලික වැඩ කටයුතු කිහිපයක් සම්පූර්ණ කර නව කටයුතු කිහිපයක් ආරම්භ කර ඇත.

- මෙම ව්‍යපෘතියේ ප්‍රධාන ඉලක්කයන් වන නීතියේ ප්‍රමාදය සඳහා නිසි විසඳුම් ලබා දීමේ අදහසින් දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට නඩු ගොනු පරිවර්තනය කිරීමට විශේෂ පරිවර්තන ඒකකයක් අභියාචනාධිකරණයේ ස්ථාපිත කරන ලදී. ඒ අනුව නඩු ගොනු ආසන්න වශයෙන් 98ක් පමණ පරිවර්තනය කරන ලදි.

- මඩකලපුව. රත්නපුර හා අනුරාධපුර ආදී දිස්ත්‍රික්වල අපරාධ යුක්තිය පසිඳලීමේ නඩු ප්‍රවාහ කළමනාකරණ කමිටු ස්ථාපිත කොට ක්‍රියාත්මක කරන ලදී. ආදර්ශ නඩු ප්‍රවාහ කළමනාකරණ කමිටු රැස්වීම 2015 ජුනි 25 වන දින මඩකලපුවේදි පැවති අතර දෙවන කමිටු රැස්වීම 2015 ජුලි 16 වන දින රත්නපුරයේදි පැවැත්විණි.

- <u>ජාතික මට්ටමින් නඩු ප්‍රවාහ කළමනාකරණ කමිටුව පිහිටුවීම.</u>
  අධිකරණ අමාත්‍ය ගරු අචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික නඩු ප්‍රවාහ කළමනාකරණ කමිටුවේ දෙවන රැස්වීම 2015 ජුලි මස 14 දින පවත්වන ලදි.

- <u>දණ්ඩන මාලාව තුළ නඩු ප්‍රවාහ කළමනාකරණයට පවතින අභියෝග පිළිබඳව ආයතනික අවශ්‍යතා තක්සේරු කිරීම.</u>
  දණ්ඩන මාලාවට සම්බන්ධවන ආයතනයන් තුළ, විධිමත් ආයතනික අවශ්‍යතා තක්සේරු කිරීමක් සිදුකිරීමට වෙරීටේ පර්යේෂණයක් සඳහා ගිවිසගෙන ඇත. කොටස්කරුවන්ගේ සම්මුඛ සාකච්ඡා වලින් බහුතරයක් 2015 වර්ෂයේදී නිමකර තිබේ.

- නඩු ප්‍රවාහ කළමනාකරණය පිළිබඳව සමුළුව අධිකරණ වෛද්‍ය නිලධාරීන් වෙනුවෙන් පවත්වා තිබේ.

- ගොඩගැසී ඇති නඩු විසඳා අවසන් කිරීමේදී ප්‍රමුඛතාව ලබාදිය යුතු නඩු හඳුනා ගෙන ක්‍රියා කිරීම සඳහා නඩු කටයුතු පැවරීමේ කාර්යයන්වලදී සහය ලබාදීම
  ගොඩගැසී ඇති සමහර නඩු ගොනු විසඳා අවසන් කිරීම සඳහා රජයේ අධි නීතීඥවරුන් 8 දෙනෙකුගේ සහය නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලබාදීම පිණිස අධිකරණ අමාත්‍යාංශය, විසින් නීතිපති දෙපාර්තමේන්තුව හා එක්ව අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. අවධානය යොමුකළ නඩු ගොනුතුලින් මත්ද්‍රව්‍ය ඒකකයට 902, ළමා අපයෝජන ඒකකයට 865 මහජන පෙත්සම් ඒකකයට 80ක් අයත්වේ.

- <u>නීති අධාර සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම</u>
  අධිකරණ අමාත්‍යාංශය හා නීති අධාර කොමිසමේ සහයෝගය ඇතිව නීති අධාර සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් ගොඩනැගීම සඳහා කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී.

- යාපනය මඩකලපුව ත්‍රිකුණාමලය කිලිනොච්චි සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවල ඉඩම් ආශ්‍රිත ආරවුල් සම්බන්ධ සමථකරණ මණ්ඩල ස්ථාපිත කිරීමට සහයෝගය ලබාදීම.
- වින්දිතයින් හා සාක්ෂිකරුවන් පනතට සහයෝගය ලබා දීම.
  අධිකරණ අමාත්‍යාංශය විසින් කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කයන්හි පිහිටි කළාප කාර්යාල තුල 70 වකට අධික පොලිස් නිලධාරීන් සඳහා පැවැත් වූ එක් දින පුහුණු සැසිය සඳහා නීති ආධාර කොමිෂමට සහයෝගය ලබා දෙන ලදී.
- අපරාධ නඩු විධාන සංග්‍රහය සහ දණ්ඩ නීති සංග්‍රහය (දෙමළ බසට පරිවර්ථනය කල) සිංහල දෙමළ සහ ඉංග්‍රීසි බසින් ඒකාබද්ධ කර සමාලෝචනය කොට මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලයට යොමුකර ඇත. සාක්ෂි ආඥා පනත සහ අධිකරණ සංවිධාන පනත ඒකාබද්ධ කිරීම සහ 2015 සැප්තැම්බර් මාසවල භාරගෙන ඇත.
- ඉංග්‍රීසි භාෂාවෙන් ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීම පිළිබඳ විධිමත් පුහුණුවක් 2014 දෙසැම්බර් මස ක්‍රියාවට නංවන ලද අතර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ සියළුම නිළධාරීන් සඳහා මෙම පාඨමාලාව කොළඹ බ්‍රිතාන්‍ය කවුන්සලය මගින් සිදුකරණ ලදී
- අපරාධ යුක්තිය සවිබල ගැන්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයට සහයෝගය ලබාදීම.

## ▪ <u>එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (UNICEF) සහයෝගිතාව ඇතිව ආරම්භ කරන ලද ළමා ආරක්ෂාව සහ ළමා අධිකරණ පිළිබඳ ව්‍යාපෘතිය (CPJJ)</u>

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ළමා අපයෝජන පිළිබඳ නඩු සම්බන්ධයෙන් ක්‍රියා කර ඒවා විභාග කොට අවසන් කිරීම, කඩිනම් කිරීම සහ ළමා අපයෝජනයට ගොදුරු වූවන් දෙවන වතාවටත් වින්දිතයින් බවට පත්වීම වැළක්වීමයි. මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ ආයතනවලට නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළත්වේ. අදාළ ළමා අපයෝජන සිද්ධිය පිළිබඳ පැමිණිලි පොලිසියට ඉදිරිපත් කළ දිනයේ සිට වසරකට අඩු කාලයක් ඇතුළත ඊට අදාළ ළමා අපයෝජන නඩු සම්බන්ධයෙන් ක්‍රියාකර, එම නඩු විභාග කොට අවසන් කිරීම කඩිනම් කිරීම මෙම නව ක්‍රියාමාර්ගයෙන් අපේක්ෂා කරනු ලැබේ. එසේම අපරාධයට ගොදුරුවූ ළමා වින්දිතයින් පවතින අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට අවතීර්ණ වීම නිසා නැවත වතාවක් වින්දිතයින් බවට පත්වීම වැළක්වීම සාක්ෂාත් කර ගැනිමටද මෙම ව්‍යාපෘතියෙන් ඉලක්ක කරනු ලැබේ.

- CPJJ ව්‍යාපෘතිය මඟින් පොලිස් නිලධාරින් සඳහා තෙදින වැඩමුළුවක් පෙබරවාරි මාසයේදි පවත්වන ලදී.
- නීති පද්ධතිය තුළ ළමා ආරක්ෂණය ඉලක්ක කරමින් උපදේශන මණ්ඩලයක් සහ මෙහෙයුම් කමිටුවක් මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ස්ථාපිත කර ඇත. මෙම උපදේශන මණ්ඩලය මඟින් වත්තල හා මීගමුව මහේස්ත්‍රාත් අධිකරණ වල ළමා අපයෝජන නඩු පමණක් ඇසීමට 2015 ජුනි මාසයේදී වෙනමම දින දෙකක් වෙන් කරන ලදි.
- තවද CPJJ ව්‍යාපෘතිය මඟින් වෝහාරික වෛද්‍ය විද්‍යා ව්‍යාධිවේදීන්ගේ පාසැලේ ළමා ආරක්ෂණය පිළිබඳ වාර්ෂික වැඩසටහන පැවත්වීම සඳහා තාක්ෂණික සහයද සපයා ඇත.

- මේ වන විට CPJJ ව්‍යාපෘතිය මඟින් අම්පාර, මොණරාගල, වවුනියාව, මඩකලපුව, අනුරාධපුරය සහ යාපනය අධිකරණ වල නවීකරණ කටයුතු කෙරෙහි අවධානය යොමුකර ඇති අතර අම්පාර අධිකරණයේ නවීකරණ කටයුතු සිදුකරමින් පවතී.

- <u>ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව</u>

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන යෝජිත ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති වාර්තා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ගරු අධිකරණ අමාත්‍යතුමාගේ සභාපතීත්වය යටතේ ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව පත් කරන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව යටතේ නිලධාරීන්ගේ කමිටුවක් පත්කරන ලද අතර එම නිලධාරී කමිටුව විසින් ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳව අධ්‍යයනය කොට සිය තීරණ සහ නිර්දේශ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත වාර්තා කරනු ලැබේ.

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරිය ව්‍යවස්ථා සම්පාදනය පිළිබද අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ කැඳවුම්කරු වන අතර ව්‍යවස්ථා සම්පාදනය සම්බන්ධයෙන් නිලධාරි මට්ටමෙන් විශ්ලේෂණ සහ නිර්දේශ සිදුකරනු ලබන්නේ අධිකරණ අමාත්‍යාංශයේදීය. බොහෝ විට මෙම නිර්දේශ ව්‍යවස්ථා කෙටුම්පතක් ආකාරයෙන් ක්‍රියාත්මක කෙරේ.

අනතුරුව, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් නිලධාරීන්ගේ කමිටුවේ නිර්දේශ කියවා බලා කාරක සභාවේ නිර්දේශ සඳහන් කරනු ලබයි. අධිකරණ අමාත්‍යාංශය විසින් මෙම නිර්දේශ සංග්‍රහ කොට අවශ්‍ය කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශය වෙත යවනු ලැබේ. අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත ඉදිරිපත් කෙරන සියලු පනත් කෙටුම්පත් සහ ප්‍රතිපත්ති වාර්තා සකස් කර නිර්දේශ කඩිනමින් යවා ඇත.

- <u>මිනිස් ජාවාරමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය</u>

2010 වර්ෂයේදී, අධිකරණ අමාත්‍යාංශය විසින් මිනිස් ජාවාරමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය පිහිටුවන ලද අතර, ශ්‍රී ලංකාව තුළ මිනිස් ජාවාරමට එරෙහිව සිදුකරන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම පිණිස මෙම කාර්ය සාධක බලකාය ජාතික සම්බන්ධීකරණ ආයතනය වශයෙන් කටයුතු කරනු ලබයි. නඩු කටයුතු පැවරීම වේගවත් කිරීම සහ වින්දිතයන්ගේ ආරක්ෂාව දැඩි කිරීම පිණිස රජයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය සවිබල ගැන්වීම මෙම ජාතික කාර්ය සාධක බලකායේ අරමුණයි. රට තුළ සිදුවන මිනිස් ජාවාරම් වලට විසඳුම් සැපයීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන වශයෙන් හඳුනා ගන්නා ලද සියළුම රාජ්‍ය ආයතනයන්හි නියෝජිත වරුන්ගෙන් මෙම ජාතික කාර්ය සාධක බලකාය සමන්විත වේ.

මිනිස් ජාවාරමට ගොදුරු වූ වින්දිතයින් හඳුනාගැනීම, උපදෙස් සඳහා යොමු කිරීම සහ ඔවුන්ගේ ආරක්ෂාව නංවාලීම සම්බන්ධයෙන් සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි කාර්ය සාධක බලකාය විසින් වැඩි දියුණු කරන ලදි. එය අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් අනුමත කර ඇති අතර, 2015 මාර්තු මාසයේදී ක්‍රියාත්මක කරන ලදී.

මිනිස් ජාවාරමට ගොදුරු වූ කාන්තා වින්දිතයන්ට රැකවරණ නිවාසයක් පිහිටුවීම ජාතික වැදගත්කමක් සහිත හදිසි අවශ්‍යතාවයක් වන බවට කාර්ය සාධක බලකාය විසින් හඳුනා ගනු ලැබූ අතර, එය 2012 වසරේ දී ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී.

කාර්ය සාධක බලකායේ සෘජු අධීක්ෂණය යටතේ කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් රැකවරණ නිවාසය සඳහා මාර්ගෝපදේශ වැඩි දියුණු කළඅතර , 2015 ජුනි මාසයේදී රැකවරණ නිවාසයේ කාර්ය මණ්ඩලයට පුහුණුවක් ලබා දෙන ලදී.

කාර්ය සාධක බලකාය විසින් මිනිස් ජාවාරම පිළිබඳව මහජනතාව සහ රාජ්‍ය නිලධාරින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී සාමාජික ආයතන අධීක්ෂණයට ලක් කරයි.

තවද, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සඳහා ශක්‍යතා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම කෙරෙහි කාර්ය සාධක බලකායේ විශේෂ අවධානය යොමු වී ඇත.

## 5.2 පාලන හා ආයතන අංශය

අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතන හා අධිකරණ සඳහා ප්‍රශස්ථ මෙන්ම පුහුණු මානව සම්පතක් ලබා දීම සහතික කිරීම ආයතන හා පාලන අංශයේ ප්‍රධාන අරමුණ වේ. ඒ යටතේ අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම, බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම, තෝරා ගැනිම, බඳවා ගැනිම, පුහුණු කිරිම, ස්ථාන මාරුකිරීම, උසස් කිරීම හා විනය කටයුතු මෙම අංශයෙන් ඉටු කරනු ලබයි. මේ යටතේ අධිකරණ අමාත්‍යාංශයේ ඍජු පාලනයට යටත්වන කාර්ය මණ්ඩලයේ 215 කගේ සහ අධිකරණවල කාර්ය මණ්ඩලය 3697 ක ගේ පරිපාලන කටයුතු මෙම අංශයෙන් ඉටුවේ.

මීට අමතරව ඉහත සඳහන් සියළු ආයතනවල සේවකයින්ගේ අතිකාල, ගමන් වියදම්, ණය හා අත්තිකාරම් අධිකරණ මගින් රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ වෙන්දේසි, රජයේ නිලධාරින් ගේ ඇප අනුමත කිරීමද මෙම අංශයෙන් ඉටුවේ.

තවද, හදිසි මරණ පරීක්ෂක, සාමවිනිසුරුවරු හා නිල නොලත් මහෙස්ත්‍රාත්, දිවුරුම් කොමසාරිස්වරුන් පත් කිරීම, දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් පත් කිරීම සඳහා අදාළ නිර්දේශ ලබා දිම ද මෙම අංශයෙන් ඉටුකරනු ලබයි.

2015 ජනවාරි මාසයේදී සිදුවූ අමාත්‍ය මණ්ඩල සංශෝධනයන් සමඟ මෙම අමාත්‍යාංශයේ විෂය පථයට නීතිපති, නීති කෙටුම්පත් හා මහා භාරකාර දෙපාර්තමේන්තු පැවරීම් මත ආයතනික කටයුතු විශාල ලෙස පුළුල් විය. ඒ අනුව 2015 වසරට අදාල ක්‍රියාකාරී සැලැස්මට අදාලව 2015.01.01 සිට 2015.12.31 දින දක්වා කාලය තුළ මෙම අංශයෙන් ඉටු කරන ලද සේවාවන් පහත පරිදිවේ.

- <u>තනතුරු ඇති කිරීම</u>

මුදල් රෙගුලාසි 71 යටතේ ඉහත කාලය තුළ අළුතින් ඇති කරන ලද තනතුරු පහත පරිදි දැක්වේ.

| ආයතනය | මාණ්ඩලික ශ්‍රේණිය | සමාන්තර සේවා | කණිෂ්ඨ සේවක | එකතුව |
|---|---|---|---|---|
| අධිකරණ | - | - | 88 | 88 |
| ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | - | - | 02 | 02 |
| විනිසුරු පුහුණු ආයතනය | - | 01 | 03 | 04 |
| ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුව | - | 04 | - | 04 |

- <u>බඳවා ගැනිමේ පටිපාටි සකස් කිරිම සහ බඳවා ගැනිමේ පටිපාටි අනුමත කරවා ගැනිම</u>

මෙම කාලය තුළ බඳවා ගැනීමේ පරිපාටි 01 ක් අනුමත කරගෙන ඇති අතර බඳවා ගැනීමේ පරිපාටි 03ක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- **බඳවා ගැනීම සහ පත් කිරිම**

  - බඳවා ගැනීම

| ආයතනය | තනතුර | බඳවාගත් සංඛ්‍යාව |
|---|---|---|
| අධිකරණ අමාත්‍යාංශය | අතිරේක ලේකම් - නීති (උසස්වීම්) | 02 |
| | රියදුරු | 02 |
| අධිකරණ අමාත්‍යාංශය (අධිකරණ සඳහා) | කා.සේ.සේ | 119 |
| කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | අධිකරණ ආරක්ෂක | 24 |
| | ලඝු ලේඛිකා | 24 |
| | කා.සේ.සේ | 01 |
| සමථ මණ්ඩල කොමිෂන් සභාව | රියදුරු | 01 |
| අභියාචනාධිකරණය | කා.සේ.සේ | 07 |
| රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | කා.සේ.සේ | 02 |

  - පත් කිරීම්

ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කරන ලද පත් කිරීම් සහ නිර්දේශයන් පහත පරිදි වේ.

| තනතුර | පත්කිරීම් සංඛ්‍යාව |
|---|---|
| දිවුරුම් කොමසාරිස් | 956 |
| හදිසි මරණ පරීක්ෂක | තාවකාලික පත්කිරීම් 11 |
| සාමවිනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත් | 33 |
| සාම විනිසුරු | 2,436 |
| සාම විනිසුරු හැඳුනුම්පත් නිකුත් කිරීම් | 2929 (මේ තුලින් රජයට ලැබුණු ආදායම රු585,800) |
| දිවුරුම් දුන් භාෂා පරිවර්තක | 06 |

- **ලේඛණ සනාථ කිරීම්**

  - විදේශ කටයුතු අමාත්‍යාංශය, තානාපති කාර්යාල හා වෙනත් අවශ්‍යතාවන් සඳහා ඉදිරිපත් කිරීමට මහජනයා විසින් රැගෙන එන දිවුරුම් ප්‍රකාශ හා භාෂා පරිවර්තකයින් පිළිබඳ සනාථ කිරීම් සඳහා දිනපතා ලිපි ලේඛන 50 – 60ක් අතර ප්‍රමාණයක් ඉදිරිපත් කරන අතර අදාල ලේඛන සනාථ කර දීම ආයතන අංශය මඟින් දිනපතා සිදු කරනු ලබයි.

- **පුහුණු කිරීම්**

  - දේශීය

    අධිකරණ අමාත්‍යාංශයේ සේවය කරනු ලබන මාණ්ඩලික නිලධාරීන්ගේ සිට සුළු සේවකයින් දක්වා සියළුම සේවක ශ්‍රේණි ආවරණ වන පරිදි පහත දැක්වෙන අයුරින් පුහුණුවීම් ලබා දෙන ලදී.

| පුහුණුවේ ස්වභාවය | නිලධාරි සංඛ්‍යාව |
|---|---|
| විෂයානු බද්ධ | 267 |
| නායකත්ව පුහුණු | 20 |
| අභිප්‍රේරණ | 60 |

- විදේශීය

| පුහුණුවේ ස්වභාවය | නිලධාරි සංඛ්‍යාව |
|---|---|
| පුහුණු (විනිසුරුවරුන් ඇතුළුව) | 305 |
| සම්මන්ත්‍රණ | 33 |

- ණය අනුමත කිරීම

| ණය අනුමත කිරීම | | |
|---|---|---|
| ණය වර්ගය | සංඛ්‍යාව | මුදල (රු) |
| දේපළ/නිවාස | 74 | 95,151,952.00 |
| වාහන | - | - |
| ආපදා | 126 | 8,832,875.00 |
| උත්සව | 224 | 2,240,000.00 |
| විශේෂ | 75 | 300,000.00 |
| පාපැදි | 11 | 66,000.00 |

2015.08.17 දින සිට දේපල / නිවාස හා වාහන ණය අනුමත කිරීම් බලය අදාල දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ මහාධිකරණ විනිසුරුවරුන් වෙත පවරා දෙන ලදි.

- වෙන්දේසි කිරීම

අධිකරණ වලින් රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ වෙන්දේසි හා ඒ තුලින් රජයට එකතු වූ ආදායම පහත පරිදිවේ.

| වෙන්දේසි සංඛ්‍යාව | ආදායම (රු) |
|---|---|
| 30 (භාණ්ඩ) | 18,072,427.00 |
| 15 (වැලි) | 4,558,095.00 |

- නිල රථ රක්ෂණය කිරීම

| ආයතනය | නිල රථ සංඛ්‍යාව | | මුදල (රු) |
|---|---|---|---|
| අමාත්‍ය කාර්ය මණ්ඩලය | 08 | (පූර්ණ) | 1,514,781.21 |
| අධිකරණ නිලධාරීන්ගේ නිල රථ | 161 | (පූර්ණ) | 10,686,180.54 |
| | 01 | (තුන්වන පාර්ශව) | 1,147.94 |
| අමාත්‍යාංශයේ නිල රථ | 25 | (පූර්ණ) | 1,334,681.59 |
| | 08 | (තුන්වන පාර්ශව) | 10,905.45 |

- අමාත්‍යාංශය සතු වාහන වෙන්දේසි කිරීම.

  **2015.01.01** සිට **2015.12.31** දක්වා පාවිච්චියෙන් ඉවත් කරන ලද වාහන විකිණීමෙන් පහත සඳහන් ආදායම් උපයාගත හැකි විය.

| | |
|---|---|
| වාහන විකිණීමෙන් ලද මුලු ආදායම | **28,598,180.00** |
| ටෙන්ඩර් පත් අවලංගු වීමෙන් ලද ආදායම | **80,000.00** |
| ටෙන්ඩර් පත් විකිණීමෙන් ලද ආදායම | **194,000.00** |
| ටෙන්ඩර් මඟින් වාහන විකිණීමෙන් ලද සම්පූර්ණ ආදායම | **28,872,180.00** |

- අධිකරණ කාර්ය මණ්ඩලය සඳහා ඵලදායිතා සංකල්පය හඳුන්වා දීම.

  අධිකරණ **102** ක් හා කම්කරු විනිශ්චය සභා **36**ක් සඳහා මේ වන විට ඵලදායිතා සංකල්පය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. එයින් අධිකරණ **94**ක් හා කම්කරු විනිශ්චය සභා **36** ක් අදාල ඵලදායිතා තරඟාවලි සඳහා ද ඉදිරිපත් වී ඇත. දැනට අදාල තරඟාවලියේ ජයග්‍රාහකයන් තෝරා ගෙන ඇති අතර ඉදිරියේ දී ඒ සඳහා ත්‍යාග ප්‍රදානය සඳහා සැලසුම් කර ඇත.

## 5.3 <u>ගිණුම් අංශය</u>

අධිකරණ අමාත්‍යාංශයේ ගිණුම් කටයුතුවල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීම පිණිස අමාත්‍යාංශ පාලන හා අධිකරණ පාලන වැය ශීර්ෂයන් යටතේ පහත සඳහන් පරිදි ගිණුම් විධිමත් කිරීමේ කටයුතු **2015** වර්ෂයේ සිදුකර ඇත.

මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් පහත ආකාරයෙන් ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ.

1. ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය
2. අමාත්‍යාංශ පරිපාලනය
3. අධිකරණ පරිපාලනය
4. සමථ මණ්ඩල කොමිෂන් සභාව
5. නීති ආධාර කොමිෂන් සභාව / ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය

**2015.01.01** සිට **2015 12.31** දක්වා ප්‍රගතිය

අමාත්‍යාංශ පරිපාලන ශීර්ෂ **110 - 1, 2 , 3**

| විස්තරය | ඇස්තමේන්තුව (රුපියල්) | වියදම (රුපියල්) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | **764,220,000** | **685,851,696** |
| ප්‍රාග්ධන වියදම් | **110,537,000** | **88,538,798** |
| මුළු එකතුව | **874,757,000** | **774,390,494** |

අධිකරණ පරිපාලන 228 - 1, 2

| විස්තරය | ඇස්තමේන්තුව (රුපියල්) | වියදම (රුපියල්) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 5,061,927,000 | 4,992,982,468 |
| ප්‍රාග්ධන වියදම් | 1,205,092,000 | 824,065,687 |
| මුළු එකතුව | 6,267,019,000 | 5,817,048,155 |

## 5.4 යටිතල පහසුකම් අංශය

අධිකරණ අමාත්‍යාංශයේ යටිතල පහසුකම් අංශය මගින් අධිකරණ පද්ධතිය සඳහා අවශ්‍ය නව අධිකරණ සංකීර්ණ හා විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කටයුතු වැනි වැදගත් කාර්යභාරයන් රාශියක් ඉටු කරනු ලබයි.

### 2015.01.01 සිට 2015.12.31 දක්වා ඉදිකිරීම් අවසන්කර ඇති ව්‍යාපෘති


1. හිඟුරක්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ ලේඛණාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම
2. මහියංගනය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ ලේඛණාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම
3. මතුගම දිසා අධිකරණයේ ගරාජය හා මහජන වැසිකිලි පද්ධතිය ඉදිකිරිම
4. නාවුල මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිම
5. මඩකලපුව උසාවි ගොඩනැගිල්ලේ II අදියර ඉදිකිරිම





6. ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය






7. කැකිරාව දිසා අධිකරණයේ විනිශ්චය ආසනය දැව වලින් ඉදිකිරීම.

8. හොරණ අධිකරණ සංකීර්ණයේ නව මුර කුටිය ඉදිකිරීම

9. බණ්ඩාරවෙල දිසා අධිකරණයේ තාප්පය ඉදිකිරීම

10. සයින්දමරුදු කාති අධිකරණය ඉදිකිරිම

## 2015.01.01 සිට 2015.12.31 දක්වා ඉදිකිරීම් ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති

1. ගාල්ල අධිකරණ සංකීර්ණය





2. හෝමාගම අධිකරණ සංකීර්ණය





3. වත්තල අධිකරණ සංකීර්ණය





4. ගලගෙදර උසාවි ගොඩනැගිල්ල





5. මාතර අධිකරණ සංකීර්ණය
6. ඇඹිලිපිටිය නව මහේස්ත්‍රාත් අධිකරණය හා තාප්පය ඉදිකිරීම
7. මූතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිකිරිම
8. වැල්ලවාය අධිකරණයේ ලේඛණාගාරය ඉදිකිරිම
9. පුත්තලම මහාධිකරණ විනිසුරු නිල නිවස ඉදිකිරීම
10. පොළොන්නරුව මහාධිකරණ විනිසුරු නිල නිවස ඉදිකිරීම
11. බිබිල මහේස්ත්‍රත් නිල නිවස ඉදිකිරීම
12. ඇල්පිටිය අධිකරණයේ කාර්යාලය ඉදිකිරීම
13. අවිස්සාවෙල්ල මහාධිකරණයේ තාප්පය ඉදි කිරීම
14. ගම්පොළ දිසා විනිසුරු නිල නිවසේ ආරක්ෂක මුර කුටිය ඉදිකිරීම
15. හෙල්බොඩ සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ වැසිකිලි පද්ධතිය ඉදි කිරීම
16. ගම්පොළ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ වැසිකිලි පද්ධතිය ඉදි කිරීම
17. මහනුවර බෞද්ධ අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම
18. බදුල්ල අධිකරණ සංකීර්ණයේ කාර්යාලය හා ආපනශාලාව ඉදිකිරිම
19. තිස්සමහාරාම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය ඉදිකිරීම
20. කලවන්චිකුඩි අධිකරණයේ නව ලේඛනාගාරය සහ නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම
21. කෑගල්ල සිවිල් අභියාචන අධිකරණයේ පළමු මහල ඉදිකිරීම
22. ගාල්ල දිසා අධිකරණයේ තාප්පය හා කෑම කාමරය ඉදිකිරීම
23. පේදුරුතුඩුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය ඉදිකිරීම
24. ආනමඩුව මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාර සහ නඩුභාණ්ඩ කාමර ඉදිකිරීම
25. නිකවැරටිය මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාර සහ නඩුභාණ්ඩ කාමර ඉදිකිරීම
26. හෙට්ටිපොළ මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාර සහ නඩුභාණ්ඩ කාමර ඉදිකිරීම
27. ගල්ගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාර සහ නඩුභාණ්ඩ කාමර ඉදිකිරීම
28. කැස්බෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාර සහ නඩුභාණ්ඩ කාමර ඉදිකිරීම

## 2015.01.01 සිට 2015.12.31 දක්වා කාලය තුළ නවීකරණය කර ඇති ගොඩනැගිලි

1. කොළඹ මහේස්ත්‍රාත් නිල නිවස අළුත්වැඩියා කිරීම
2. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ හා ප්‍රධාන මහේස්ත්‍රාත් නිල නිවස අළුත්වැඩියා කිරීම
3. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ යටි මහල නඩු භාණ්ඩ කාමරයක් බවට පත් කිරීම
4. කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අළුත්වැඩියා කිරීම
5. ගම්පහ දිසා අධිකරණයේ කාර්ය මණ්ඩල කෑම කාමරය අළුත්වැඩියා කිරීම
6. කන්තලේ මහේස්ත්‍රාත් නිල නිවස අළුත්වැඩියා කිරීම
7. කෑගල්ල දිසා විනිසුරු නිල නිවස අළුත්වැඩියා කිරීම
8. මාතර දිසා විනිසුරු නිලනිවස අළුත්වැඩියා කිරීම
9. ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ වැසිකිළිය අළුත්වැඩියා කිරීම
10. නුගේගොඩ මහේස්ත්‍රාත් නිල නිවාස මුරකුටිය අළුත්වැඩියා කිරීම
11. සියඹලාණ්ඩුව සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය නඩු භාණ්ඩ කාමරයක් බවට අළුත්වැඩියා කිරීම
12. වරකාපොළ දිසා විනිසුරු නිලනිවසේ සම්පූර්ණ අළුත්වැඩියා කිරීම
13. දෙහි අත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණයේ සම්පූර්ණ අළුත්වැඩියා කිරීම
14. වාරියපොළ දිසා විනිසුරු නිලනිවසේ අළුත්වැඩියා කිරීම
15. අක්කරෙයිපත්තු මහේස්ත්‍රාත් අධිකරණයේ අළුත්වැඩියා කිරීම
16. කෑගල්ල අතිරේක දිසා විනිසුරු නිල නිවසේ සම්පූර්ණ අළුත්වැඩියා කිරීම
17. මීනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් කාමරය වෙන් කිරීම, මුරකුටිය ඉදිකිරීම,මෝටර් සයිකල් නැවතුම් පොළ ඉදිකිරීම
18. කොළඹ 7 මහාධිකරණ විනිසුරු නිල නිවස අළුත්වැඩියා කිරීම

## 2015.01.01 සිට 2015.12.31 වන විට මූල්‍ය ප්‍රගතිය (228 -01- 01)

| | විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|---|
| **2502** | ගොඩනැගිලි ඉදිකිරීම | **700,000,000** | 369,766,779 |
| 1 | ගාල්ල අධිකරණ සංකීර්ණය | 105,000,000 | 34,168,278 |
| 2 | හෝමාගම අධිකරණ සංකීර්ණය | **183,510,000** | 86,427,650 |
| 3 | වත්තල අධිකරණ සංකීර්ණය | **50,000,000** | **11,355,268** |
| 4 | මඩකලපුව අධිකරණ සංකීර්ණය අදියර II | **56,490,000** | 45,578,898 |
| 5 | ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය | **5,000,000** | **0** |
| 6 | ගලගෙදර අධිකරණ ගොඩනැගිල්ල | **50,000,000** | 5,585,904 |
| 7 | මාතර අධිකරණ ගොඩනැගිල්ල | **50,000,000** | **0** |
| 8 | සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘති | **200,000,000** | 186,650,781 |
| **2001** | ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය | **200,000,000** | 187,240,390 |
| | මුළු මුදල | 900,000,000 | 557,007,169 |

## 5.5 සංවර්ධන අංශය

සංවර්ධන අංශය මඟින් අධිකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි සංවර්ධන කාර්යයන් ඉටු කිරිම හා සම්බන්ධීකරණය සිදු කරනු ලබයි. 2015 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුව ප්‍රධානව අනිකුත් ආයතන වල සංවර්ධන කාර්යයන් සිදු කරනු ලැබීය. බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව, නීතිය, සාමය හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විෂය පථය යටතට පත්වීමත් සමඟ 2015 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුල සංවර්ධන අංශය විසින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

- යටිතල පහසුකම් අංශය හා සැලසුම් අංශය සමඟ ඒකාබද්ධව අධිකරණ අමාත්‍යාංශයට අදාල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම.
- ඉඩම් අත්පත් කර ගැනීමේ පනත, රජයේ ඉඩම් ආඥා  පනත හා සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අධිකරණ අමාත්‍යාංශය සතු ඉඩම් වල නිරවුල් භාවය තහවුරු කිරීම.
- අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා ගොඩනැගිලි හා විනිශ්වයකාරවරුන් සඳහා නිල නිවාස, බදු හෝ කුලී පදනම මත ලබා ගැනීමට කටයුතු කිරිම.
- සැලසුම් අංශය සමඟ ඒකාබද්ධව දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා පර්යේෂණ සිදු කිරීම.
- අමාත්‍යාංශ යටතේ ඇති ආයතන සම්බන්ධිකරණය කරමින් රජය විසින් හඳුන්වා දෙනු ලබන විවිධ සංවර්ධන වැඩසටහන්ක්‍රියාත්මක කිරීම

## 5.6 සැලසුම් අංශය

සැලසුම් අංශය මගින් අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු  සහ ආයතන වලට අදාලව සැලසුම් කිරීම, ව්‍යාපෘතිවල පසු විපරම් කටයුතු මෙන්ම පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

- අමාත්‍යාංශය සඳහා වාර්ෂික මූලධන  අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- ඊට අදාළ  ප්‍රගතිය සකස් කිරීම සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම.
- වාර්ෂික කාර්යය සාධන වාර්තාව සකස් කිරීම.
- ප්‍රගති වාර්තාව පිළියෙල කිරීම. (ඉදිරි වර්ෂයේ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම)
- නඩු සම්බන්ධ සංඛ්‍යා ලේඛන රැස් කිරීම.
- නඩු පිළිබඳ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම.

- ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීම සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් ලබා ගැනීමට කටයුතු කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික විගණන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම.
- අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වල ප්‍රගති සමාලෝචන සහ පසු විපරම් කටයුතු සිදුකිරිම.
- අධිකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

## 5.7 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු, උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය, විනිසුරු පුහුණු ආයතනය සහ නීති ආධාර කොමිෂන් සභාව යන ව්‍යවස්ථාපිත ආයතන තුනත්, අමාත්‍යංශ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන සමථ මණ්ඩල කොමිෂන් සභාවත්, අධිකරණ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයත් අධිකරණ පරිපාලන වැය ශීර්ෂය යටතේ වන මහාධිකරණ, සිවිල් අභියාචනා මහාධිකරණ, දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ වල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය කටයුතු කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය ප්‍රධාන අභ්‍යන්තර විගණක, ගණකාධිකාරි (අභ්‍යන්තර විගණන), මුල්‍ය සහකාර නිලධාරින් 06 ක්, සංවර්ධන නිලධාරින් 06ක්, සහ කළමනාකරණ සහකාර නිලධාරින් 04 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම නිලධාරින් ක්‍රම විගණනය කෙරෙහි විශේෂ අවධානයකින් යුක්තව ඉහත සඳහන් ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලබන අතර 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා මහාධිකරණ 13 ක්, දිසා/මහේස්ත්‍රාත් අධිකරණ 18ක්, දිසා අධිකරණ 07ක්, මහේස්ත්‍රාත් අධිකරණ 20ක්, කම්කරු විනිශ්චය සභා 19 සිවිල් අභියාචන මහාධිකරණ 07ක්, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන15 ක් සහ විශේෂ විමර්ෂණ 02ක් ආදී වශයෙන් සම්පූර්ණ විගණන පරික්ෂණ 101ක් සිදුකර ඇත.

# 06. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල ප්‍රගතිය

## 6.1 නීතිපති දෙපාර්තමේන්තුව

### දැක්ම

ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරිම සඳහා ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්විමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කිරිම.

### මෙහෙවර

- ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සපුරාලීම උදෙසා, ගෞරවනීයවත්, අභිමානවත් ලෙසත්, අවංක ලෙසත් කටයුතු කිරිම සහ අපගේ උපරිමයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සේවය කිරිම.

- සාමාජීය සහ ආර්ථික සෞභාග්‍යය, සම අවස්ථාවන් සහ මානව දයාව දිරිගැන්විමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලාංකීය ජනතාව උදෙසා සාධාරණත්වය, ආරක්ෂාව සහ ස්වාධීනත්වය තහවුරු කරනු වස්, අපක්ෂපාතීව සහ සාධාරණ ලෙස ශ්‍රී ලංකාවේ නීතින් ක්‍රියාත්මක කිරිමට නිතිපති දෙපාර්තමේන්තුව ප්‍රයත්න දරනු ඇත.

### අරමුණ

- ශ්‍රී ලංකා රජය සහ රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියලු නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියේ දි සුවිශේෂී මෙහෙවරක් ඉටු කිරිම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නීති නිලධාරියා නීතිපතිවරයා වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ගණන් දීමේ නිලධාරියා වශයෙන් ගරු නීතිපති තුමා කටයුතු කරයි. “ඒ” ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන නීතිපති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **1933/13, 2015.09.21** දරණ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශය භාරයේ පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව, මධ්‍යම රජයට, පළාත් සභාවලට රජයේ දෙපාර්තමේන්තුවලට , ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනිකුත් අර්ධ රාජ්‍ය ආයතනවලට නීතිමය සහය ලබාදෙයි. එකී සහය ලබාදීමේදී දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වාණිජ යන කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීමත්, දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනෙකුත් අධිකරණ වල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීමත් සිදු කරනු ලැබේ.

සිවිල් අංශය, අපරාධ නඩු අංශය හා රාජ්‍ය නීතිඥ අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනක් මගින් දෙපාර්තමේන්තුවේ සිවිල් හා අපරාධ නඩු වලට අදාලව කටයුතු ඉටු කරනු ලබන අතර පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශ වලට අමතරව දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීලෙස ක්‍රියාත්මක කිරීමට සංස්ථා අංශය, හදිසි අවස්ථා නියෝග හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරන ඊ්ආර් ඒකකය, ළමා අපචාර නඩු ඒකකය, ආගමන හා විගමන ඒකකය, මහජන පැමිණිලි ඒකකය,ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය යන ඒකක නීතිපති දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මකව පවතී.

### 6.1.1 නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, වාණිජ යන කාරණා, ජාත්‍යන්තර නීති කටයුතු සහ එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමිසමට අදාල කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතනවලට උපදෙස් දීම.
- දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීම.
- නව නිති සම්මත කිරීමේදි හා පවතින නිති සංශෝධනය කිරීමේදි අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේදී, දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති අංශ නීති කාර්ය මණ්ඩලයට සහාය වෙයි.

- අපරාධ නඩු අංශය
- සිවිල් අංශය
- රාජ්‍ය නීතිඥ අංශය
- ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය
- සංස්ථා අංශය

තවද දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකක ද ක්‍රියාත්මකවේ.
එම ඒකක වන්නේ;

- මහජන පෙත්සම් ඒකකය (මහජන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මෙම අංශයයි)
- ළමා අපචාර නඩු ඒකකය (ළමුන් අපචාරවලට ලක් කිරීමට අදාල නඩු පිළිබඳ ක්‍රියාකිරීම පිණිස පිහිටුවා ඇත)
- ඊ්ආර් ඒකකය (හදිසි අවස්ථා නියෝග සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරයි)
- ආගමන සහ විගමන ඒකකය (ආගමන හා විගමන පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරයි)

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත කී අංශ සහ ඒකක කටයුතු කරනු ලබන අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත.

### 6.1.2 එක් එක් අංශයන්හි 2015.01.01 සිට 2015.12.31 දක්වා කාර්ය සාධනය පහත පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

| ශාඛාව | විවෘත කල ලිපිගොනු සංඛ්‍යාව | අධි චෝදනා යැවූ ගොනු සංඛ්‍යාව | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කල ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කල ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| *සිවිල් අංශය | **2719** | **-** | **158** | **-** | **171** |
| අපරාධ නඩු අංශය | **4791** | **2019** | **975** | **471** | **3473** |
| *රාජ්‍ය නීතිඥ අංශය | **165** | **-** | **-** | **-** | **3315** |
| ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය | **508** | **-** | **-** | **-** | **532** |
| සංස්ථා අංශය | **1681** | **-** | **-** | **-** | **1871** |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | **3338** | **577** | **370** | **854** | **1801** |
| මහජන පෙත්සම් අංශය | **591** | **-** | **35** | **-** | **217** |

*සිවිල් අංශය මඟින් විවෘත කරනු ලබන ගොනු වලින් බහුතර සංඛ්‍යාවක් රාජ්‍ය නීතිඥ අංශය හරහා කටයුතු කරනු ලබන බව සලකන්න

**2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---:|---:|
| පුනරාවර්තන වියදම් | **657,616,000** | **655,066,755** |
| ප්‍රාග්ධන වියදම | **610,500,000** | **91,192,070** |
| එකතුව | **1,268,116,000** | **746,258,825** |

## 6.2 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

<u>දැක්ම</u>

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

## මෙහෙවර

**රාජ්‍ය ප්‍රතිපත්තීන්, නීතිය බවට පරිවර්තනය කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම**

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/13, 2015.09.21 දරණ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශය භාරයේ පවතී.**

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයන් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම ය. එසේ රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේ දී දෙපාර්තමේන්තුව විසින්, නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම , පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ අදාළ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අනුනීති ප්‍රතිශෝධනය කිරීම සිදු කරයි. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගිවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේදී පාර්ලිමේන්තුව සමඟ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීමද දෙපාර්තමේන්තුවට පැවරී ඇති රාජකාරී කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන තවත් රාජකාරියකි.**

## 2015.01.01 සිට 2015.12.31 දක්වා ප්‍රගතිය

## 2015 වර්ෂයේ පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද පනත්

| | | |
|---|---|---|
| 01 | විසර්ජන (සංශෝධන) පනත | 01/2015 |
| 02 | ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත | 02/2015 |
| 03 | දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත | 03/2015 |
| 04 | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත | 04/2015 |
| 05 | ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත | 05/2015 |
| 06 | මඩහපොළ ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 06/2015 |
| 07 | දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය | 0000 |
| 08 | ආගාමික හා විගාමික (සංශෝධන) පනත | 07/2015 |
| 09 | ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ) පනත | 08/2015 |
| 10 | දේශීය ආදායම් (සංශෝධන) පනත | 09/2015 |

| | | |
|---|---|---|
| 11 | මුදල් පනත | 10/2015 |
| 12 | එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 11/2015 |
| 13 | ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | 12/2015 |
| 14 | ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | 13/2015 |
| 15 | ඔට්ටු ඇල්ලීම හා සුරාබදු (සංශෝධන) පනත | 14/2015 |
| 16 | විසර්ජන (සංශෝධන) පනත | 15/2015 |
| 17 | විසර්ජන පනත | 16/2015 |

## 2015 වැඩ අවසන් කළ පනත් කෙටුම්පත්

| | | |
|---|---|---|
| 01 | ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත | LDO 25/2005 |
| 02 | කාලාවරෝධී ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත | LDO 21/2010 |
| 03 | විදුලිබල පනත් කෙටුම්පත | LDO 19/2014 |
| 04 | විදුලි සංදේශ බදු පනත් කෙටුම්පත | LDO 15/2015 |
| 05 | ථෙරවාද භික්ඛු කතිකාවත | LDO 15/2014 |
| 06 | ධීවර හා ජලජ සම්පත් සංශෝධිත පනත් කෙටුම්පත | LDO 46/2015 |
| 07 | බෞද්ධ විහාර දේවාලගම් පනත් කෙටුම්පත | LDO 20/2014 |
| 08 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත | LDO 35/2015 |
| 09 | ක්ෂුද්‍ර මූල්‍ය පනත් කෙටුම්පත | LDO 32/2012 |
| 10 | සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත | LDO 27/2015 |
| 11 | සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත | LDO 51/2015 |
| 12 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත | LDO 33/2013 |
| 13 | දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) | LDO 28/2015 |
| 14 | අපරාධ නඩු විධාන සංග්‍රහය(සංශෝධන) | LDO 40/2015 |
| 15 | විගණන පනත | LDO 3/2015 |
| 16 | තොරතුරු පනත | LDO 4/2015 |

**2015.12.31 දින වන විට, පනත් කෙටුම්පත් 23 ක ද, උපකාරක නීති 62 ක ද, පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ පනත් කෙටුම්පත් 18 ක ද භාෂාත්‍රයෙන් සකසා වැඩ අවසන් කර ඇත.**

## 2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම(රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | 87,840,000 | 76,206,838, |
| ප්‍රග්ධන වියදම | 70,810,00 | 11,920,605 |
| එකතුව | 158,650,000 | 88,127,443 |

## 6.3 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

1969 අංක 3 දරණ නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර, ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය වේ. පරිපාලනය සඳහා ත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහා ත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

දැක්ම.

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

මෙහෙවර.

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

අරමුණු සහ කාර්යයන්.

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ, නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ. එවැනි ප්‍රවර්ධන අරමුණු කරගනිමින් නීති කොමිෂන් සභාව මගින් පහත දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.

I. නීතිය සංග්‍රහ ගත කිරීම.

II. නීතියේ විෂමතා නැති කිරීම.

III. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතියද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.

IV. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.

V. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.

VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.

VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

IX. අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්, අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

X. නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.

XI. සිංහල භාෂාවෙන්, දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

### 6.3.2. <u>2015.01.01 සිට 2015.12.31 දක්වා කාර්ය සාධනය</u>

- නීති කොමිෂන් සභාවේ නව සමාජිකයන් පත් කරන ලදී.
- නීති කොමිෂන් සභාව ඇප පනත, බෙදුම් පනත, ළමයින්ගේ රැකවරණය, විවාහ විය හැකි වයස, ත්‍යාග ඔප්පු ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම, පැරේට් ඇස්කීසිය, ශ්‍රේෂ්ඨාධිකරණ රීති සංශෝධන යන නීතිමය කරුණු සම්බන්ධයෙන් සලකා බැලීමට යෝජනා කරන ලදි.
- අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මහජනතාවගෙන් සහ වෘත්තීමය සංගම් මගින් අදහස් විමසීම සඳහා මහජනයා හට තම අදහස් යොමු කරනු පිණිස නීති කොමිෂන් සභාව මගින් පුවත්පත් මගින් දැන්වීම් පළකරනු ලැබීය.

<u>නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව විසින් වර්තමානයේ පහත සඳහන් නීති ප්‍රතිසංස්කරණ කටයුතු ඉටුකිරීමේ නිරතව සිටියි.</u>

- <u>පරවේණි නිළකාරයා හට බෙදුම් නඩුකරයක් ගොණු කිරීමට ඇති අයිතිය.</u>

  **1951** අංක **16** දරන බෙදුම් පනත සංශෝධනය සඳහා '*පරවේණි නිළකාරයා හට බෙදුම් නඩුකරයක් ගොණු කිරීමට ඇති අයිතිය*' යන මැයෙන් යෝජනා පත්‍රයක් ඉදිරිපත් වු අතර එම බෙදුම් නීතිය සම්බන්ධයෙන් වන යෝජිත සංශෝධන සහිත කෙටුම්පත අධිකරණ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලදි.

- <u>සමාජ වෙබ් අඩවි සහ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිවාසිකම.</u>

  *සමාජ වෙබ් අඩවි සහ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිවාසිකම* සම්බන්ධයෙන් වන සංශෝධන සහිත කෙටුම්පත සකස්කර ඇත.

- <u>ශ්‍රේෂ්ඨාධිකරණ රීති සංශෝධනය</u>
- <u>අභියාචනාධිකරණ සම්බන්ධයෙන් වන සංශෝධනය (ඇපැල් ක්‍රියාපටිපාටි නීතිය).</u>

  අභියාචනාධිකරණ සම්බන්ධයෙන් වන සංශෝධනය සඳහා යෝජිත සංශෝධන සහිත කෙටුම්පත සකස්කර ඇත.

- <u>ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් වන දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගය.</u>
- <u>මෝටර් රථ වාහන පනත සංශෝධනය.</u>
- <u>වෙනස් කළ නොහැකි ත්‍යාග ඔප්පු ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම.</u>
- <u>ජාතික ඖෂධ පාලන අධිකාරි පනත</u>
- <u>වගකීම සීමිත හවුල් ව්‍යාපාර නීතිය පිළිබඳ සංශෝධන</u>
- <u>ත්‍රස්තවාදය වැළක්වීමේ පනත සංශෝධනය</u>
- <u>යෝජිත පෞද්ගලිකභාවය සම්බන්ධයෙන් වන නීතිය</u>

**2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (235-01-01)**

| විස්තරය | ප්‍රතිපාදන(රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | **15,000,000** | **10,095,392** |
| ප්‍රාග්ධන වියදම | **2,000,000** | **1,131,701** |
| එකතුව | **17,000,000** | **11,227,093** |

## 6.4 ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

**දැක්ම**

**සාධාරණ සහ නීති ගරුක සමාජයක් ගොඩනැගීම.**

**මෙහෙවර**

**අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ වෙනත් ආයතනවලට අධිකරණ විද්‍යා සහ ආහාර විද්‍යා ක්ෂේත්‍රයන් සම්බන්ධ විශ්ලේෂණ, විශේෂඥ සහ උපදේශක සේවාවන් සැපයීම.**

**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ලංකාවේ ඇති එකම අධිකරණ විද්‍යා රසායනාගාරය වේ. ආහාර විද්‍යා අංශය, ආහාර හා මධ්‍යසාර, කිරි හා ජලය යනුවෙන් වූ විද්‍යාගාර හතරකින් ද අධිකරණ විද්‍යා අංශය, ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍යය, ගිණි විශ්ලේෂණ, මත්ද්‍රව්‍ය අංශය, මස්තු විද්‍යා, අධිකරණ ධූලක විද්‍යා, සැක කටයුතු ලේඛන අංශය, විවිධ අංශය යනුවෙන් ප්‍රධාන අංශ හතකින්ද යනුවෙන් අනු අංශ 11කින් සමන්විත වේ. මෙය සේවාවන් සඳහා වෙන්වූ දෙපාර්තමේන්තුවක් වන අතර උසාවි, පොලිස්, රේගුව, සුරාබදු, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය, වරාය, වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මගින් යොමුකරනු ලබන නඩුභාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂණයන්ට ලක් කිරීම සහ ඒවා පිළිබඳ වාර්තා නිකුත් කිරීම කරනු ලැබේ. මීට අමතරව විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ආදර්ශ තත්වපාලන කටයුතු පිළිබඳ පරීක්ෂා කරනු ලබන අතර ශ්‍රී ලංකා රේගුව යොමු කරන ආදර්ශ තත්වපාලන කටයුතු සහ තීරු බදු වර්ගීකරණය යන කරුණු දෙකම උදෙසා පරීක්ෂා කරනු ලබයි. තවද අධිකරණ මගින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛන පරීක්ෂා කිරීම හා වාර්තා කිරීමද මෙම දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලබයි. පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, ආහාර හා ඖෂධ පනත, ජාතික පාරිසරික පනත , සුරාබදු ආඥා පනත , දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පලිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිනි අවි ආඥා පනත, පුපුරණ ද්‍රව්‍ය පනත, විෂවර්ග, අබිං සහ අන්තරායකාර ඖෂධ පනත, තහනම් පිහි පනත, මොටර් වාහන පනත, අපාරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි අඥාපනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරේ.**


**මෙවැනි සේවා සැපයීමට අමතරව මෙම දෙපාර්තමේන්තුවේ සිටින විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විද්‍යාඥයින් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදු කරයි.**

විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සෑදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ මිලදී ගැනීම් වලදි තාක්ෂණික කමිටු වලට විශේෂඥ සහාය ලබාදීමද මෙම නිලධාරින් විසින් සිදු කරනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුව 2013 වර්ෂයේ මැයි මස බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශයේ නවීන විද්‍යාත්මක උපකරණ හා සියළු පහසුකම් වලින් සමන්විත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදී.

අධිකරණ විද්‍යා අංශයට අත්‍යාවශයව තිබූ ඩී.එන්.ඒ. රසායනාගාරයකට අවශ්‍ය සියලු උපකරණ සහිතව මෙම පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු සිදුකරගෙන යනු ලැබේ. තවද මෙම දෙපාර්තමේන්තුවේ පළාත් රසායනාගාරයක්ද කුරුණෑගල පිහිටා ඇත.

## <u>2015.01.01 සිට 2015.12.31 දක්වා ප්‍රගතිය</u>

| අංශය | 2015.01.01 දින ඉතිරි නඩු සංඛ්‍යාව | ලැබී ඇති නඩු සංඛ්‍යාව | වාර්තා කල නඩු සංඛ්‍යාව | 2015.12.31 දක්වා වාර්තා නොකල නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය අංශය | 326 | 7,269 | 6,978 | 617 |
| ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය | 454 | 361 | 436 | 379 |
| පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය | 254 | 315 | 407 | 162 |
| අධිකරණ ධූලක විද්‍යා අංශය | 1,302 | 2,062 | 2,299 | 1065 |
| අධිකරණ මස්තු විද්‍යා අංශය | 1,196 | 1,330 | 1,242 | 1284 |
| සැක කටයුතු ලේඛණ අංශය | 383 | 769 | 886 | 266 |
| අධිකරණ විද්‍යා විවිධ අංශය | 195 | 273 | 321 | 147 |
| ප්‍රධාන කාර්යාලය (මත්පැන්) | 1 | 2,079 | 2,079 | 1 |
| මධ්‍යසාර හා දුම්කොළ | 8 | 1,799 | 1,784 | 23 |
| කුරුණෑගල (මත්පැන්) | 27 | 2,726 | 2,753 | 0 |
| ආහාර පනත යටතේ ආහාර සාම්පල | 93 | 5,973 | 6,059 | 7 |
| විවිධ ආහාර | 52 | 1,487 | 1,535 | 4 |
| එකතුව | 4,291 | 26,443 | 26,779 | 3,955 |



## **2015.01.01 සිට 2015 .12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (233-01-01)**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | **224,800,000** | **210,080,000** |
| ප්‍රාග්ධන වියදම | **290,500,000** | **162,600,000** |
| එකතුව | **515,300,000** | **372,680,000** |

## 6.5 මහා භාරකාර දෙපාර්තමේන්තුව

### දැක්ම

**පරිත්‍යාගශීලී දානපතියන් විසින් මහා භාරකාරතැන කෙරෙහි තබන ලද විශ්වාසය අනුව විවිධ කාර්යයන් සඳහා යෙදවීමට පරිත්‍යාගකරන ලද මුදල්/දේපළ අදාළ ස්ථාපකවරුන් ගේ ද තෙස්තමේන්තුකරුවන් ගේ ද පොදු මහජනතාව ගේ ද අභිලාෂයන් සහ අවශ්‍යතාවයන් සපිරෙන පරිද්දෙන් නෛතික රාමුවක් තුළ සැමට උපරිම ප්‍රතිලාභයක් සලසමින් විශ්වාසනීය භාරකරුවෙකු වශයෙන් ක්‍රියාකිරීම.**

### මෙහෙවර

**දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද දේපළ, බූදල්, වන්දි සහ මුදල් වෘත්තීමය දැනීම සහ නිපුණතාවය මත පරිපාලනය, කළමනාකරණය සහ ආයෝජනය කරමින් ඒවායේ අර්ථලාභීන්/ උරුමකරුවන්/ යැපෙන්නන්/ ලබන්නන් හට විශ්වාසනීය, කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබාදීම.**

### 6.5.1 මහා භාරකාරධූරය හා නෛතික ශක්‍යානුතාවය

**1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මඟින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මඟින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මඟින් සංශෝධිත 1922 අංක 01 දරණ මහා භාරකාර ආඥා පනත මඟින් ශ්‍රී ලංකාව තුළ මහා භාරකාරධූරය, ස්වාධීන අවිච්න්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිතව ස්ථාපිතකොට ඇති අතර, ධූරයේ නාමයෙන් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට නෛතික ශක්‍යානුතාවයක් සහිත වේ.**

**මහා භාරකාරවරයාගේ කටයුතු සම්බන්ධයෙන් සහය වීම සඳහා 1988 අංක 61 දරන ආඥා පනතේ 04 වන ඡේදය යටතේ නියෝජ්‍ය මහා භාරකාරවරයකු හෝ කිහිපදෙනෙකු පත් කල හැක. නෛතික කාර්ය භාරයක් ඉටුකරන එකී ධූරයන් සඳහා නිලධාරීන් තෝරාපත්කර ගැනීමේ දී ප්‍රධානම සුදුසුකම වන්නේ නීතිඥවරයෙකුවීම ය.**

### 6.5.2 නෛතික පසුබිම

1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මඟින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මඟින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මඟින් සංශෝධිත 1922 අංක 1 දරණ මහා භාරකාර ආඥා පනත යටතේ මහා භාරකාරධූරය ස්වාධීන නෛතික පුද්ගලයෙක් ලෙස ස්ථාපිත කර ඇති අතර, අදාළ ආඥා පනත් අනුව ආයතනය සහ ඒ අනුශාංගික කරුණු පාලනය වේ.

භාර සම්බන්ධයෙන් මහා භාරකාර ආඥා පනතට අමතරව 1918 අංක 04, 1934 අංක 1 දරණ ආඥා පනත් මඟින් ද 1968 අංක 7 සහ 1971 අංක 30 දරණ පනත් මඟින් ද සංශෝධිත 1917 අංක 9 දරණ භාර ආඥා පනත බලපැවැත්වෙන අතර, එකී පනත නිහඬවන්නා වූ යම් අවස්ථාවක දී ඉංග්‍රීසි සාධාරණත්ව (Law of Equity) අදාළ වේ.

### 6.5.3 කාර්යභාරය

මහා භාරකාර ආඥාපනත, සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මත පහත කාර්යභාරයන් මහා භාරකාරතැන වෙත පැවරී ඇත.

1. සාමාන්‍ය භාරකරුවකු, රැකවරණ භාරකරුවකු හෝ ආරක්‍ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
2. දේපළ රැස්කිරීමේ නියෝග යටතේ දේපළ රැස්කිරීම.
3. බාලවයස්කරුවකු ගේ දේපළ භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්‍ෂක කළමනාකරුවකු) ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මඟින් පවරන ලද අවස්ථාවක).
4. සිහිවිකල් පුද්ගලයකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මඟින් පවරන ලද අවස්ථාවක).
5. නිශ්චල දේපළ ගිවිසුම්ගත කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම. (ආරක්‍ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවල දී එම භාරයන්හි පත්කර ඇති "භාරකාර මණ්ඩලය" මඟින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්‍ෂක භාරකරු බැඳී සිටී).
6. විදේශගත වූ ශ්‍රී ලාංකිකයකු ගේ ඇටර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාදීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.
7. සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මගින් දේපළ සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
8. ගරු අධිකරණය මඟින් පවරන අවස්ථාවල දී අන්තිම කැමති පත්‍රයක් රහිත පුද්ගලයකු ගේ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම.
9. අධිකරණ සංවිධාන පනත මත දේපළ රැස්කරන්නකු ලෙස කටයුතු කිරීම.
10. වරදකට සිරගතවූවකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.
11. ඕනෑම පුද්ගලයෙකු ගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්‍ෂිතව තැන්පත් කර තබාගන්නකු ලෙස කටයුතු කිරීම.
12. විභාරස්ථ දේපළෙහි භාරකරු වශයෙන් කටයුතු කිරීම.

## 6.5.4 උක්ත කාර්යයන් හැර වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි මහා භාරකාරතැන ගේ මැදිහත්වීම

මහා භාරකාර ආඥා පනතට පසුව කරන ලද සංශෝධනයන් අනුව සහ වෙනත් ලිඛිත නීති අනුව පැවරී ඇති වෙනත් කාර්යයන්.

- **1988 අංක 61 දරණ පනත මඟින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තියට ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගත වන්නන්, විදේශයක දී මිය ගියහොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් සහ/හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදී දීම කාර්යක්‍ෂම සහ නිවැරදි ලෙස සිදුකිරීම සහ එකී කාර්යය පහසුකිරීම සඳහා අදාළ සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම.**
- **1944 අංක 42 දරණ විහාර ඉඩම් (වන්දි) ආඥා පනත ක්‍රියාත්මක කිරීම.**
- **1981 අංක 42 දරණ පනතින් සංශෝධිත 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් පනත යටතේ පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම.**
- **1973 අංක 28 දරණ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.**

## 6.5.5 මහා භාරකාරතැනගෙන් සැලසෙන සේවාවන්

මෙම දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව/අන්තිම කැමතිපත්‍රවල ඇති අරමුණු අනුව/අධිකරණ නියෝග මත පහත විෂයයන්හි කටයුතු කරමින් ජනතාවට සේවය කරනු ලබයි.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත් දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- අසරණ සහ හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකර ලබා ගැනීම සඳහා වෛද්‍යාධාර ලබාදීම.
- ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව මූල්‍යාධාර සැපයීම.
- පුණ්‍යාධාර කටයුතු.
- විවිධ හේතූන් නිසා ජීවත්වීමට අපහසු අසරණ පුද්ගලයන්ට සහ එවැනි පුද්ගලයන් සිටින ආයතනවලට ආධාර කිරීම.
- විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරාගන්නා ලද නිශ්චල දේපළ සඳහා හිමිවන වන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා ගේ නිර්දේශ මත බෙදාහැරීම.
- භාර/ බූදල් දේපළ කළමනාකරණය කිරීම.
- අධ්‍යාපනය හදාරන මූල්‍යමය දුෂ්කරතා ඇති දක්‍ෂ දරුවන් දිරිමත් කිරීම අරමුණු කොට ඇති භාරයන්ගෙන් ආදායම උපයෝගි කරගනිමින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
- සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්‍ෂක මණ්ඩලයේ දෙදෙනෙකු හා සභාපති පත්කිරීම.

- විදේශ වන්දි බෙදාහැරීම.
- විහාර වන්දි බෙදාහැරීම.
- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබාදීම. **(2015** ජනවාරි සිට දෙසැම්බර් **31** දක්වා කාලය තුල රු: **10,188,334.08** ක මුදලක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබා දී ඇත).

### 6.5.6 භාර බුදල් සංඛ්‍යාව

**2015.12.31** දිනට දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාර සංඛ්‍යාව **1044**ක් වන අතර, දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන බුදල් සංඛ්‍යාව **137**කි. භාර ආරම්භ කළ දානපතින් ගේ අරමුණු අනුව අදාල කාර්යයන් ඉටු කරනු ලැබේ.

| වර්ෂය | ක්‍රියාත්මක කරන භාර සංඛ්‍යාව | ක්‍රියාත්මක කරන බුදල් සංඛ්‍යාව |
|---|---|---|
| **2011** | **981** | **119** |
| **2012** | **999** | **126** |
| **2013** | **1019** | **130** |
| **2014** | **1034** | **134** |
| **2015** | **1044** | **137** |

### 6.5.7 රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති මුදල් ප්‍රමාණය

මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති සහ පිහිටුවා ඇති භාර හා බුදල්වලට අදාලව මහා භාරකාර ආඥාපනත යටතේ අය කරනු ලබන මූලධන, ආයෝජන, ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු පහත පරිදි රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.

| වර්ෂය | මුදල (රු:) |
|---|---|
| **2011** | **3,783,187.40** |
| **2012** | **6,543,360.52** |
| **2013** | **6,396,102.51** |
| **2014** | **6,675,487.77** |
| **2015** | **10,188,334.08** |

### 2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | **45,450,000** | **41,352,337** |
| ප්‍රාග්ධන වියදම | **2,905,000** | **2,727,038** |
| එකතුව | **48,355,000** | **44,079,375** |

## 6.6 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

### දැක්ම

නිශ්චල දේපල සම්බන්ධයෙන්වූ ණය ගනුදෙනු වලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩ පිළිවෙළක් සලසාදීම.

### මෙහෙවර

උකස්කරයක්,පොරෙන්දු සින්නක්කරයක් හෝ හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පු සම්බන්දව ගත් ණය මුදලක් සඳහා ඇපයට බැඳී ඇති කෘෂිකාර්මික හෝ ගේදොර ඉඩකඩම් ආදි වූ නිශ්චල දේපලක් ණය සහනදායි අන්දමට වාරික මඟින් හා අඩු පොලී අනුපාතයට ගෙවා නිදහස් කරගැනීමට ණයකරුවන්ට අවශ්‍ය නීතිමය රැකවරණය හා සහන සලස්වාදීම.

### අරමුණ

නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර, පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි වූ අයවිය යුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණවීම.
1941 අංක 39 දරණ ණය සහනදායක අඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. මෙහි ප්‍රධාන අරමුණ ඉඩකඩම්, කුඹුරු, වතුපිටි, නිවාස වැනි නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු මත, හෝ උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සහ පොරොන්දු නෝට්ටු, චෙක්පත් වැනි ලියවිලි මත, ලබා ගත් ණය සම්බන්ධයෙන් ණය ගැතිවී ඇති මහජනතාව එයින් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියාමාර්ගයක් හඳුන්වා දිම වෙයි. මීට අමතරව 1999 අංක 29 දරන පනත මගින් කරන ලද සංශෝධනයට අනුව හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වි සහන සැළැස්විමට හැකිවිමෙන් මෙම සහනදායි ක්‍රියා මාර්ගය තවත් පුළුල්වි ඇත.

මෙම මණ්ඩලය අමාත්‍යවරයා පත් කරනු ලබන සමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් එක් සමාජිකයෙකු මණ්ඩලයේ සභාපති ලෙස අමාත්‍යවරයා විසින් පත්කරනු ලබයි. මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටු කරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් වන බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාවට මෙමගින් ලැබී ඇති සේවය අති විශාලය. එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතිඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් එයින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය.

මෙම මණ්ඩලයේ රාජකාරී කටයුතු සාමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය ඉදිරියේදී එළඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළඹෙන ගිවිසුම් මිස ණය සහන දායක මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවෙයි. එසේ වුවද අසාධාරණ පොලී ප්‍රමාණයන් අඩු කිරීමටද මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණය කරුවන්ට සහතිකයක් නිකුත් කිරීමටද මණ්ඩලයට බලතල ඇත. එසේම ණයහිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කල නොතීසිය පරිදි විභාගයට නොපැමිණියහොත් ඒක පාක්ෂික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කරනු ලබයි.

එසේ වුවද, එම ක්‍රියාමාර්ග ගනු ලබන්නේ, ලියාපදිංචි තැපෑලෙන් සහ ග්‍රාම නිලධාරි මඟින් දැන්වීම භාරදීමෙන් පසුව පවත්වනු ලබන පරීක්ෂණයට පෙනී සිටීම ණයහිමියා විසින් හිතාමතාම පැහැර හැරීම කර ඇති බවට මණ්ඩලය සෑහීමකට පත්වන අවස්ථාවක දීය. එවැනි අවස්ථාවල දී, එවැනි සහතිකයක් නිකුත් කිරීමේ වාසිය ණයගැතියාට උපචිත වේ. එකී සහතිකය, එකී කාරණාව සම්බන්ධයෙන් නඩු විභාග කරනු ලබන අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, ණය ගෙවා පියවීම සඳහා අවුරුදු 10ක උපරිමයකට යටත්ව යම් කාලයක් ලබාදීමටත් පොළිය අවම අනුපාතයකට පහළ දැමීමටත් නඩු ගාස්තු ණයගැතියාගෙන් අය කර නොගැනීමටත් ණය සහනදායක අඥාපනත ප්‍රකාරව එකී අධිකරණයට බලය පැවරේ.

## 2015.01.01 සිට 2015.12.31 දක්වා කාර්ය සාධනය

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව ( 2015.01.01) | 788 |
| නව ඉල්ලුම්පත් සංඛ්යාව | 417 |
| සමාලෝචනය සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 44 |
| මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 1249 |
| සමථයට පත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 179 |
| නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 172 |
| සමාලෝචනය කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | 29 |
| සහතික නිකුත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 11 |
| ඉල්ලා අස්කර ගත් ඉල්ලුම් පත් සංඛ්‍යාව | 24 |
| පියවර ගත් මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 415 |
| වසර අවසානයේ අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 834 |

## 2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (231-01-01)

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 11,000,000 | 8,887,647 |
| ප්‍රාග්ධන වියදම් | 1,000,000 | 493,008 |
| එකතුව | 12,000,000 | 9,380,655 |

## 6.7 නීති ආධාර කොමිෂන් සභාව ( LAC )

නීති ආධාර කොමිෂන් සභාව 1978 අංක 27 දරණ නීති ආධාර පනත මගින් ස්ථාපිත කරන ලදි. දරිද්‍රතාව නිසා යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට නොහැකි වූ ශ්‍රී ලංකාවේ දුගී ජන කොටස් සඳහා නීති ආධාර සැපයීම මෙහි ප්‍රධාන අරමුණ වේ. අඩු ආදායම්ලාභී ජනතාවට නොමිලේ නීතිඥ සහාය ලබාදීම, සමස්ත සමාජයම නීතිය පිළිබඳව දැනුවත් කිරීම, නව නීති සම්පාදනයේදී හා නෛතික නීති ප්‍රතිසංස්කරණවලදී. රජයට උපදේශණ කාර්යයේ නිරතවීම යනාදිය මෙහි මූලික කාර්යභාරයන් වේ.

- නීති අංශය - යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට හැකියාවක් නොමැති තැනැත්තන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටිම.

සෘජුව ප්‍රධාන කාර්යාලය යටතේ ක්‍රියාත්මක කොළඹ නීති ආධාර මධ්‍යස්ථානය ඇතුළුව නීති ආධාර මධ්‍යස්ථාන 77 ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ. නඩු කටයුතු වලදී අවශ්‍ය නීති ආධාර සැපයීම නීති ආධාර මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණවේ. මාසික ආදායම රුපියල් 15000 /= හෝ ඊට අඩු තැනැත්තන් සඳහා නීති ආධාර ලබාදෙයි. නමුත්, තමන් සඳහා සහ දරුවන් සඳහා ගාස්තු ලබාගැනීමට අපේක්ෂා කරන කාන්තාවන් සඳහා ආදායම් මට්ටම නොසළකා නීතිඥ නියෝජනය ලබාදෙයි.

නීති ආධාර කොමිෂන් සභාව මගින් සේවා සපයන ලද නඩු පිළිබඳ විස්තර.

| අනු අංකය | නඩු පිළිබඳ විස්තරය | නඩු ප්‍රමාණය |
|---|---|---|
| 01 | 2014 වසරේඉදිරියට ගෙන එන ලද නඩු සංඛ්‍යාව | 20,625 |
| 02 | 2015 වර්ෂයේදී අලුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | 10,449 |
| 03 | 2015 වර්ෂයේ පැවති මුළු නඩු ගණන | 31,074 |
| 04 | 2015 වර්ෂය තුළදී අවසන් කරනු ලැබූ නඩු සංඛ්‍යාව | 7,465 |
| 05 | 2016 වර්ෂයට රැගෙන ගිය නඩු සංඛ්‍යාව | 23,609 |
| 06 | 2015 වර්ෂයේදී නීති අධාර ලබා දුන් මුළු සේවා දායකයින් ගණන | 76,579 |

- වැඩසටහන් හා ව්‍යාපෘති අංශය

- රූපවාහිනි මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කළ වැඩසටහන්

විවිධ රූපවාහිනි ආයතන වලින් ලැබෙන ආරාධනාවන්ට අනුව මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කොමිෂන් සභාවේ නීති කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී. 2015 වසරේ මෙවැනි වැඩසටහන් ගණනාවක් කොලම්බෝ ටීවී, සියත ටීවී, හිරු ටීවී සහ ශ්‍රී ලංකා රූපවාහිනි යන නාලිකා වල පවත්වා ඇත.

- මහජනතාවගේ නීතිමය ගැටලුවලට පුවත්පත් මගින් පිළිතුරු ලබාදීමේ වැඩසටහන්

පුවත්පත් වල නීති ප්‍රශ්න පිළිතුරු පිටු පලකිරීම, මහජනතාවගේ ගැටළු විසඳීම හා මහජනතාවගේ නීතිමය දැනුම වැඩිකිරිම සඳහා නීති ආධාර කොමිෂන් සභාව ගත් තවත් පියවරකි. මීට අමතරව කාලීන වශයෙන් උනන්දුවක් දක්වන මාතෘකා සම්බන්ධයෙන් නීති ආධාර කතුවැකි පවත්වා ගෙන යයි.

- දැනුවත් කිරීමේ සහ සමාජ සහභාගීත්වයෙන් පවත්වන වැඩසටහන්

නෛතික සායන සහ දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම නීති ආධාර කොමිෂන් සභාවේ විෂය පථයට අයත් අත්‍යාවශ්‍ය අංගයකි. **2015** වසරේ වැඩසටහන් **219**ක් පමණ පවත්වනු ලැබ ඇත.

## සංවර්ධන නීති ආධාර අංශ

- සංක්‍රමණික සේවකයින් සම්බන්ධයෙන් තොරතුරු ඒකකය

ගැටළුවලට මුහුණපෑ සංක්‍රමණික සේවකයින් සඳහා මෙම අංශය විසින් **2015** වසරේ උපදේශන වැඩසටහන් පවත්වා තිබේ. උපදේශන සේවා ලබාදීමෙන් පසු එම තැනැත්තන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය වෙත හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කරන ලදී. සංක්‍රමණික සේවකයින් මුහුන පාන ගැටළු වැටුප් නොගෙවීම, ලිංගික අතවර, විදෙස් රටවලදී සිදුවන සංක්‍රමණික සේවක මරණ, නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම ආදි වශයෙන් වර්ග කරනු ලබයි. මේ අනුව විගමණික ශ්‍රමික පවුල් දැනුවත් කිරීමේ වැඩසටහන් **09**ක් මේ වසරේ පවත්වා ඇත. තොරතුරු රැස්කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් මට්ටමින් "ගැමි සංසදය" නමැති ප්‍රජා මුල ඒකක **16**ක් ආරම්භකර ඇත.

- බන්ධනාගාර රැඳවියන්ගේ ඒකකය

බන්ධනාගාරවල තදබදය අවම කිරීමේලාත් සියළුම ජනතාවට යුක්තිය සඳහා පහසු ප්‍රවේශයක් ලබාදීම සඳහාත් රාජ්‍ය පිරිවැය අවම කිරිම සඳහාත් අපේක්ෂාවෙන් ක්‍රියාත්මක වෙනවා ඇත. බන්ධනාගාර තුළ නීති සායන **40**ක් නිලධාරින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් **01**ක්ද මෙම වසර තුළදී සිදුකර ඇත. රැඳවියන් **244**ක් සඳහා ඇප අයදුම්පත්‍ර ගොනුකර ඇති අතර රැඳවියන් සඳහා ඇප නියෝග අධිකරණ මඟින් ලබාගෙන ඇත. එක්සත්ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් මුල්‍ය අනුග්‍රහය සපයයි. බන්ධනාගාර දෙපර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මකවේ.

- ආධුනික නීතිඥයින් සඳහා වන පුහුණු වැඩසටහන

වසරකදී පුහුණු වැඩසටහන් දෙකක් පවත්වනු ලැබේ. මෙය ස්වයං මුල්‍ය වැඩසටහනක් වන අතර සහභාගිවන්නන්ගෙන් ශාලා ගාස්තු , පාඨමාලාව සඳහා නිබන්ධන සකස් කිරීම ආදිය සඳහා වන ප්‍රධාන වියදම් පියවා ගැනිම සඳහා වන නාමික මුදලක් පමණක් අය කරනු ලැබේ. මේ වසර තුළදී කණ්ඩායම් **3**කට ආධුනික නීතිඥයින් **761**ක් පුහුණු කොට ඇත.

- නීති අධ්‍යයන සහතික පත්‍ර පාඨමාලාව

ස්වයං මුල්‍ය වැඩසටහනකි . සහභාගිවන්නන්ගේ ශාලා ගාස්තු, නිබන්ධන සැකසීම බාහිර දේශකයින් සඳහා දීමනා පියවා ගැනිමට පමණක් වන නාමික මුදලක් පමණක් අයකෙරේ. මෙම වසර තුළදී කණ්ඩායම් **01**ක් වශයෙන් **56**ක සංඛ්‍යාවක් පුහුණු කර ඇත.

- ආදි වාසි ජනතාවගේ අයිතිවාසිකම් සඳහා වන වැඩසටහන ,

ආදි වාසි ජනතාවගේ අයිතිවාසිකම්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, සෞඛ්‍ය වෛද්‍යවරුන් පුහුණු කිරිම් වැඩසටහන්, එච්.අයි.වි සමඟ ජීවත්වන්නන් සංක්‍රාන්ති ලිංගිකත්වයෙන් යුත් පුද්ගලයින් හා ලිංගික ශ්‍රමිකයින් සම්න්ධයෙන් වැඩසටහන් පුළුල් ව්‍යාපෘතින් වශයෙන් **2016** දි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත

අතර මේවායේ ආරම්භක වැඩසටහන් 01ක් බැගින් 04ක් ඇමෙරිකානු ආධාර වැඩසටහනේ මුල්‍ය අනුග්‍රහය මත ආරම්භ කරන ලදි.

- <u>නිලධාරීන් පුහුණු කිරීම</u>

දේශීය පුහුණු කිරීම් පමණක් මෙම වසරතුළදී සිදුකර ඇත.

| අනු අංකය | නිලධාරීන් | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | නීති නිලධාරීන් | සිවිල් නඩු විභාග සම්බන්ධව | 120 |
| 02 | නීති නිලධාරීන් | පරිගණක ඩිප්ලෝමා පුහුණුව | 50 |
| 03 | නීති නිලධාරීන් | සිවිල් හා අපරාධ නඩු කටයුතු, නායකත්ව පුහුණුව | 120 |
| 04 | නීති නිලධාරීන් | කළමණාකරන පුහුණුව | 15 |
| 05 | කළමණාකරණ සහකරුවන් | නායකත්ව පුහුණුව | 10 |
| 06 | කළමණාකරණ සහකරුවන් | ඉංග්‍රිසි භාෂාව | 10 |

- <u>සම්මානනීය සේවය</u>

පොදුජන මෙහෙවරදි සිදු කරන ලද සේවය අගය කිරිමෙහිලා ශ්‍රී ලංකා 2050 සංවිධානය මගින් 2015 වර්ෂයේදි ඇගයුම් සම්මානයට පාත්‍රවන ලදි.

<u>2015.01.01 සිට 2015.12.31 දක්වා මුල්‍ය ප්‍රගතිය (110-01-02)</u>

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් (1503) | 174,000,000 | 158,500,000 |
| ප්‍රාග්ධන වියදම් (2201) | 25,000,000 | 11,600,000 |
| මුළු වියදම් | 199,000,000 | 170,100,000 |

## 6.8 <u>සමථ මණ්ඩල කොමිෂන් සභාව</u>

1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත මගින් සමථ මණ්ඩල කොමිෂන් සභාව පිහිටුවන ලදී. ඒ යටතේ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් සඳහාම සමථ මණ්ඩල පිහිටුවීම ආරම්භ කරන ලදි. මෙය අධිකරණ ක්‍රියාවලිය පහසු කරලීමේ අරමුණින් ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමවේදයක් ලෙස අධිකරණ වෙත ඉදිරිපත් වන ආරවුල් වලින් සුළු ආරවුල් විසඳාලීම උදෙසා සකස් කරන ලද ඉතා වටිනා වැඩපිළිවෙලක් ලෙස හඳුන්වා දිය හැකිය. මේ වන විට ශ්‍රී ලංකාව පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 329 ක පිහිටුවා ඇති සමථ මූල මණ්ඩලවල සමථකරුවන් 8266 ක පමණ පිරිසක් ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබයි.

සමථ මණ්ඩල කොමිෂන් සභාව සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් පත්කිරීමේ බලය අතිගරු ජනාධිපතිතුමා සතුවෙයි. පනතේ සඳහන් පරිදි සමථ මණ්ඩල කොමිෂන් සභාවේ

සාමාජිකයින් පස්දෙනාගෙන් තිදෙනෙකු උපරිමාධිකරණවල විශ්‍රාමික විනිශ්චයකාරවරුන් විය යුතුය. සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් සමථකාරවරුන් පත් කිරීම, මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය වැනි සමථ මූල මණ්ඩලවලට අදාල පරිපාලනමය කටයුතු සිදුකරනු ලබයි.

සමථකරණ ක්‍රියාවලිය මඟින් පාර්ශවකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර ඇතිවන ආරවුල් විසඳා ගැනීම සඳහා තුන්වන පාර්ශවයක් ලෙස සමථකරුවන් කටයුතු කරනු ලබයි. සමථ මූලමණ්ඩල වලට ලැබෙන අරවුල් ප්‍රමාණය මත සමථ මූල මණ්ඩල වල කාර්යක්ෂමතාවය මනිනු ලබයි.


තමන්ගේ ගැටළු විසඳීමට පහසු හා අඩු වියදම් යාන්ත්‍රණයක් ලෙස ප්‍රජාව විසින් සමථකරණය පිළිගැනීමෙන් පසු ප්‍රජාව සමථකරණය දෙසට යොමුවීම ඉහළ ගොස් ඇත. එමනිසා සෑම වසරකදීම ලක්ෂයකට අධික ආරවුල් ප්‍රමාණයක් සමථ මණ්ඩල වෙතට යොමුවේ.

## 2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා ප්‍රගතිය

| | ආරවුල් සංඛ්‍යාව |
|---|---:|
| සමථ මණ්ඩල වෙත යොමු කිරීම් | 191,543 |
| සමථයට පත් කිරීම් | 91,646 |
| ප්‍රතිශතය | 47.85% |

- **2015.12.31** වන විට පස්දින වැඩමුළු **24**ක් පවත්වා සමථකාරවරුන් **1200** ක ට ආසන්න ප්‍රමාණයක් පුහුණු කර ඇත.
- වැඩසටහන් සහකාර නිලධාරින් විසින් ප්‍රජා සමථකරණය, පාසැල් සමථකරණය හා වෙනත් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනු ලබයි. ඔවුන් පස්දින පාසැල් වැඩසටහන් **20**ක් ද, එක්දින පාසැල් වැඩසටහන් **32** ක්ද, පස්දින වෙනත් සමථකරණ වැඩසටහන් **03** ක්ද, එක්දින වෙනත් සමථකරණ වැඩසටහන් **150** ක්ද පවත්වා ඇත.

### 2015.01.01 – 2015.12.31 දින දක්වා පළාත් මට්ටමින් සමථ මණ්ඩල වල ආරවුල් ලැබීම



## 2015.01.01 සිට 2015.12.31 දින දක්වා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ ප්‍රගතිය

| | |
|---|---|
| පැවැත්විය යුතු සම්මුඛ පරීක්ෂණ ගණන | 62 |
| පවත්වා ඇති සම්මුඛ පරීක්ෂණ ගණන | 53 |
| ප්‍රතිශතය | 85% |

## 2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති සමථ මූල මණ්ඩල

| අනු අංක | දිස්ත්‍රික්කය | සමථ මූල මණ්ඩලය |
|---|---|---|
| 1 | ගම්පහ | මීගමුව |
| 2 | ගාල්ල | හික්කඩුව, ඇල්පිටිය, බලපිටිය |
| 3 | මාතර | හක්මන, තිහගොඩ.දික්වැල්ල,කොටපොල,පස්ගොඩ |
| 4 | හම්බන්තොට | අඟුණකොළපැලැස්ස, ලුණුගම්වෙහෙර, වලස්මුල්ල. |
| 5 | කුරුණෑගල | කොබෙයිගනේ, නාරම්මල, ගල්ගමුව |
| 6 | මහනුවර | නාවලපිටිය, දොළුව, හතරලියද්ද, යටිනුවර, පාතදුම්බර, හසළක |
| 7 | මාතලේ | රත්තොට, පල්ලේපොල |
| 8 | රත්නපුරය | වැලිගෙපොල, ඇහැළියගොඩ, ඉඹුල්පෙ, කොලොන්න |
| 9 | කෑගල්ල | මාවනැල්ල |
| 10 | පොළොන්නරුව | හිඟුරක්ගොඩ, තමන්කඩුව |
| 11 | මොණරාගල | බඩල්කුඹුර,සියඹලාණ්ඩුව,මඩුල්ල,මැදගම,බිබිල,තණමල්විල, කතරගම |
| 12 | යාපනය | උඩුවිල්, සන්දිලිප්පායි |
| 13 | වවුනියාව | වවුනියාව දකුණ |
| 14 | ත්‍රිකුණාමලය | මොරවැව |
| 15 | නුවරඑළිය | නුවරඑළිය |
| 16 | පුත්තලම | ආරච්චිකට්ටුව,මුන්දලම |
| 17 | කළුතර | මතුගම,බුලත්සිංහල,හොරණ,අගලවත්ත |
| 18 | අනුරාධපුර | කහටගස්දිගිලිය |
| 19 | බදුල්ල | මහියංගනය |

විශේෂ වර්ගවල ආරවුල් සම්බන්ධ සමථ මූල මණ්ඩල

| අනු අංකය | දිස්ත්‍රික්ක | සමථ මූල මණ්ඩලය |
|---|---|---|
| 1 | යාපනය | යාපනය |
| 2 | කිළිනොච්චිය | කිළිනොච්චිය |

## 2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා පත්වීම් ලබාදී ඇති සමථ මූල මණ්ඩල

| අනු අංක | දිස්ත්‍රික්කය | සමථ මූල මණ්ඩලය |
|---|---|---|
| 01 | කොළඹ | හෝමාගම, රත්මලාන, මොරටුව, කැස්බෑව, කොලොන්නාව, |
| 02 | ගම්පහ | ගම්පහ, වැකේ, බියගම,මහර,අත්තනගල්ල |
| 03 | ගාල්ල | යක්කලමුල්ල, නියාගම,ඇල්පිටිය, බලපිටිය |
| 04 | මාතර | මාලිම්බඩ, කඹුරුපිටිය, තිහගොඩ |
| 06 | කුරුණෑගල | කුලියාපිටිය,පොල්පිතිගම, නාරම්මල, කොබෙයිගනේ |
| 07 | කෑගල්ල | යටියන්තොට, දෙහිඕවිට |
| 08 | අනුරාධපුරය | නාච්චාදූව, පදවිය, මනුප, කැබිතිගොල්ලෑව |
| 09 | බදුල්ල | පස්සර |
| 10 | මොණරාගල | මඩුල්ල, බඩල්කුඹුර, සියඹලාන්ඩුව |
| 11 | යාපනය | කෝපායි, චාවකච්චේරි, නල්ලූර්,පේදුරු තුඩුව, තෙල්ලිප්පලෙයි, ඩෙල්ෆ්ට් |
| 12 | අම්පාර | දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව, දමන, තිරුක්කෝවිල්, කාරතිවු, නින්දවූර් |
| 13 | රත්නපුරය | ඇහැළියගොඩ |
| 14 | පොළොන්නරුව | හිඟුරක්ගොඩ,තමන්කඩුව, |
| 15 | ත්‍රිකුණාමලය | මොරවැව |

## 2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (110-01-03)

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 241,900,000 | 228,602,794 |
| ප්‍රග්ධන වියදම් | 1,690,000 | 1,278,100 |
| එකතුව | 243,590,000 | 229,880,894 |

## 6.9 කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලය

### දැක්ම

"රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිත භාවය වඩා තහවුරුකිරිම"

### මෙහෙවර

"ශක්තිමත් හා පුහුණු කාර්යය මණ්ඩලයක් හරහා කඩිනම් වුත් සාධාරණ වුත් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රියාවලියක් තුලින් රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිත භාවය වඩා තහවුරු කිරිම"

**1957** අංක **62** දරණ කාර්මික ආරවුල් පනතේ **31** (ආ) වගන්තිය ප්‍රකාරව ලැබෙන පැමිණිලි සම්බන්ධ ඉල්ලුම්පත් විභාග කොට විසඳීම කම්කරු විනිශ්වය සභා වෙත පැවරී ඇති මූලික වගකීමවේ. රාජ්‍ය නොවන ආයතනවල සේවක පක්ෂය රැකියාවලින් නෙරපීම් ආදී අසාධාරණකම් පිළිබඳව යුක්තිය ඉෂ්ඨ කරවා ගැනීම සඳහා ඔවුන්ට ඇති මහඟු වරප්‍රසාදයක් ලෙස කම්කරු විනිශ්වය සභාව දැක්විය හැක. කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලය යටතේ කම්කරු විනිශ්වය සභා **37** ක් ක්‍රියාත්මකවේ.

පහත සඳහන් ප්‍රදේශවල කම්කරු විනිශ්වය සභා ස්ථාපිතව ඇත.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 06 | අවිස්සාවෙල්ල | 01 | හලාවත | 01 | නාවලපිටිය | 01 |
| මහනුවර | 01 | මීගමුව | 02 | කඩුවෙල | 01 | පලාපත්වල | 01 |
| ගාල්ල | 01 | මඩකලපුව | 01 | වත්තල | 01 | බලංගොඩ | 01 |
| බදුල්ල | 01 | කුරුණෑගල | 01 | රත්මලාන | 01 | කෑගල්ල | 01 |
| රත්නපුර | 01 | ගම්පහ | 01 | මහරගම | 01 | අම්පාර | 01 |
| නුවරඑළිය | 01 | පානදුර | 01 | කොටපොල | 01 | ත්‍රිකුණාමලය | 01 |
| හැටන් | 01 | මාතර | 01 | බණ්ඩාරවෙල | 01 | කුලියාපිටිය | 01 |
| කළුතර | 01 | අනුරාධපුරය | 01 | තලවකැලේ | 01 | | |

කම්කරු විනිශ්වය සභා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මානව සම්පත්, මූල්‍ය සම්පත් ලබාදීම හා කළමනාකරණය කිරීම කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලයේ කාර්යයන්වේ. මේ හැර කම්කරු විනිශ්වය සභා සභාපතිවරුන් හැර අනෙකුත් නිලධාරීන්ගේ ආයතන හා පරිපාලන කටයුතු සහ කම්කරු විනිශ්වය සභා සභාපතිවරුන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ගෙවීම් ඇතුළුව සියළුම මූල්‍ය පරිපාලන හා ගිණුම් කටයුතු ද කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලය මගින් සිදු කරනු ලබයි.

## 2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා ප්‍රගතිය

| 2015.01.01 දිනට විසඳීමට තිබූ නඩු සංඛ්‍යාව | 2015.01.01 සිට 2015.12.31 දක්වා | | 2015.12.31 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | පැවරූ නඩු ගණන | විසඳූ නඩු ගණන | |
| **4818** | **2529** | **2344** | **5003** |

- **2015** ජනවාරි සිට දෙසැම්බර් **31** දක්වා කාලය තුල කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් **13** ක් කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙක්, ගණකාධිකාරිවරයෙක්, භාෂණ පරිවර්තක නිලධාරීන් **08** ලඝු ලේඛිකාවන් **27** ක්, රා.ක.ස.සේවයේ නිලධාරීන් **70** ක් සහ කා.සේ.සේ සේවයේ නිලධාරීන් **26** ක් සඳහා පවත්වන ලදි.

- **2015.12.31** දිනට කම්කරු විනිශ්චය සභා ලඝු ලේඛක නිලධාරීන් **118** ක් අනුමත වී ඇති අතර ඒවන විට නිලධාරීන් **100** දක්වා බඳවා ගැනීම් සිදුකර ඇත. පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

- කම්කරු විනිශ්චය සභා සඳහා අධිකරණ ආරක්ෂක තනතුරෙහි අනුමත කාර්ය මණ්ඩලය **30** කි. ඒ අනුව **2015.12.31** වන විට අධිකරණ ආරක්ෂකයින් **25** ක් දක්වා බඳවා ගැනීම් සිදු කර ඇත.

- උතුරු පළාත ආවරණය වන පරිදි යාපනය දිස්ත්‍රික්කය තුළ නව කම්කරු විනිශ්චය සභාවක් ආරම්භ කිරීම සඳහා තනතුරු ඇතිකිරිමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ **2016.01.16** දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබාදී ඇත.

## 2015.01.01 දින සිට 2015 .12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය (228-01-02)

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---:|---:|
| පුනරාවර්තන වියදම් | **291,433,000** | **285,064,308** |
| ප්‍රාග්ධන වියදම් | **12,592,000** | **9,856,996** |
| එකතුව | **304,025,000** | **294,921,304** |

## 6.10 අධිකරණ නොවන නිලධාරින්ගේ පුහුණු ආයතනය

### දැක්ම

අධිකරණ අමාත්‍යාංශයේ අංශයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් අමාත්‍යාංශයේ දැක්ම මෙම ආයතනය සඳහා ද අදාල වේ.

### මෙහෙවර

අධිකරණවල සේවයේ නියුතු විනිසුරුවරුන් හැර අනෙකුත් උපලේඛනගත හා උපලේඛනගත නොවන නිලධාරින් පුහුණු කිරීම තුළින් අධිකරණ සේවයේ කාර්යක්ෂමතාවය සහ ගුණාත්මකභාවය ඉහළ නංවා නඩු විසඳීමේ යාන්ත්‍රණයේ ඇති ප්‍රමාදයන් අවම කර ජනතාවට වඩා යහපත් සේවයක් ලබා දීම.

අධිකරණවල සේවය කරන අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීම අරමුණුකර ගනිමින් 2010 වර්ෂයේ බත්තරමුල්ල - පැලවත්තේ පිහිටි අධිකරණ ගොඩනැගිල්ලෙහි මෙම අංශය ස්ථාපිත කරන ලදී. මෙම ආයතනය මගින් මේ වන විට අධිකරණ ක්ෂේත්‍රයේ රාජකාරි සිදුකරන නිලධාරින් සහ සේවකයන් පුහුණු කිරීමේ වැඩසටහන් ගණනාවක් පහත අරමුණු මුල්කර ගනිමින් පවත්වා ඇත.

01. ආකල්ප හා විනය සංවර්ධනය
02. රාජකාරිය පිළිබඳ අවබෝධය
03. නව්‍යකරණය හා නිර්මාණකරණය
04. අල්ලස හා දූෂණය මැඩලීම

**2015 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වා ඇත.**

| අංකය | පුහුණු වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් ගණන | පුහුණුවූ පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහයක තනතුරේ නිලධාරින් පුහුණු කිරීමේ වැඩසටහන | 07 | 157 |
| 02 | පෞද්ගලික ලිපි ගොනු සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | 06 | 226 |
| 03 | ගෙවීම් කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 06 | 209 |
| 04 | විනය කාර්ය පටිපාටිය පිළිබද පුහුණු වැඩසටහන | 09 | 318 |
| 05 | ලඝු ලේඛක නිලධාරින් පුහුණු නිරීමේ වැඩසටහන | 04 | 85 |
| 06 | භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 07 | 247 |
| 07 | වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණු වැඩසටහන | 07 | 238 |
| 08 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබද පුහුණු වැඩසටහන | 06 | 201 |
| 09 | මානව සම්පත් සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 05 | 183 |
| 10 | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | 04 | 147 |
| 11 | අපරාධ නඩු කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 35 |
| 12 | සිවිල් නඩු කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 74 |
| 13 | සයමාසික දෙමළ හා ඉංග්‍රිසි භාෂා පුහුණු වැඩසටහන දෙසැම්බර් මාසයේ ආරම්භ කරන ලදී. | 02 | 80 |

# 6.11 උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

## දැක්ම

**ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණ කළමණාකරණ මණ්ඩලය ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම කළමණාකරණයකින් යුතු මණ්ඩලය බවට පත් කිරීම.**

## මෙහෙවර

උපරිමාධිකරණ සංකීර්ණ කළමණාකරණ මණ්ඩලයේ මෙහෙවර වනුයේ පවත්නා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරිම මඟින් ඒවා භාවිතයට ගන්නා විනිශ්චයකාරවරුන්, නීතිඥවරුන්, නඩු කියන්නන්, අධිකරණ අමාත්‍යාංශයේ සේවකයින් සහ මාර්ෂල් කාර්යාලයේ සේවකයින්, සෙසු මහජනතාව ඇතුළුව සියළු දෙනාට තම කාර්ය කාර්යක්ෂමව සහ ඵලදායී අයුරින් ඉටු කිරීමට සහ ඉටු කරවා ගැනීමට අවශ්‍ය වඩාත් ජන හිතකාමී පරිසරයක් සැකසීම තුළින් ආයතනයේ දර්ශනය සාක්ෂාත් කර ගැනීම වේ.

උපරිමාධිකරණ සංකීර්ණය හා එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම හා ගොඩනැගිල්ලට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම හා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 1987 අංක 50 දරණ පනත මගින් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ස්ථාපිත කර ඇත. මෙම මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වෙයි.

- අග්‍ර විනිශ්චයකාරතුමා
- අග්‍රවිනිශ්චයකාරතුමා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක්
- අභියාචනාධිකරණයේ සභාපතිතුමා
- අභියාචනාධිකරණයේ සභාපතිතුමා විසින් පත් කරනු ලබන අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක්
- අධිකරණ විෂයයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා
- රාජ්‍ය නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම්වරයා
- ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා
- කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා
- මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙක් සහ
- ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්

## 2015.01.01 සිට 2015.12.31 දක්වා ප්‍රගතිය

- උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදිවේ.
- සිවිල් අභියාචනා මහාධිකරණය තුළ ඇළුමිනියම් භාවිත කර කාර්යාල කාමර සැකසීම හා කොටස් කිරීම.
- ගොඩනැගිලි අංක 211 හි බිම් මහලේ පිහිටි කාන්තා වැසිකිලි අලුත්වැඩියා කිරීම හා එම ගොඩනැගිල්ලේම දැවයෙන් නිමවූ දොරවල් සහ ජනෙල් අලුත්වැඩියා කිරීම. එම ගොඩනැගාල්ලේම තිබූ වතුර ටැංකිය ගලවා නව ටැංකියක් ඉදිකිරිම.
- ඇළුමිනියම් ද්‍රව්‍ය භාවිතයෙන් අභියාචනාධිකරණයේ කාර්යාල කාමර කොටස් කිරීම
- උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය විසින් උපරිමාධිකරණ සංකීර්ණයේ සියළුම නඩත්තු කටයුතු, ආරක්ෂක සේවාවන් පවත්වාගෙන යාම සහ විනිසුරු වරුන්ගේ නිල නිවාස සඳහා අවශ්‍ය ආරක්ෂාව සැපයීම වැනි කටයුතු සිදු කර ඇත.
- විනිසුරුවරුන්ගේ නිල නිවාස, කාර්ය මණ්ඩල නිල නිවාස සහ ආයතනයට අයත් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.
- විනිසුරු නිල නිවාස අළුත්වැඩියා කිරීම හා මාර්ගයේ විදුලි බුබුලු සවි කිරීම.
- විනිසුරු විවේකාගාරයේ පුටු අළුත්වැඩියා කිරීම.
- උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණමණ්ඩලයේ භාවිතය පිණිස පිරියත, යන්ත්‍රසූත්‍ර, උපකරණ, ගෘහභාණ්ඩ, උපාංග කාර්යාල උපකරණ ආදිය මිලදී ගැනීම.

**2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (228-01-01)**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | **166,719,000** | **154,619,000** |
| ප්‍රග්ධන වියදම් | **32,000,000** | **6,709,000** |
| එකතුව | **198,719,000** | **161,328,000** |

# 07. අධිකරණ

පහත සඳහන් අධිකරණ සඳහා වූ ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයේ වැය සම්මතයට ඇතුළත්වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණය
- අභියාචනාධිකරණය
- මහාධිකරණ
- පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ
- දිසා අධිකරණ
- මහේස්ත්‍රාත් අධිකරණ
- කම්කරු විනිශ්චය සභා
- කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි

ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ 20 ක්, මහාධිකරණ 31ක්, වාණිජ මහාධිකරණයක්, දිසා/මහේස්ත්‍රාත්අධිකරණ 51 ක්, දිසා අධිකරණ 31 ක්, මහේස්ත්‍රාත් අධිකරණ 49 ක්, ළමා මහේස්ත්‍රාත් අධිකරණ 02 ක්, සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ 26 ක්, කම්කරු විනිශ්චය සභා 37 ක්, කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි 65 ක් සම්බන්ධයෙන් ගිණුම්කරණ වගකීම් අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලැබේ. මහාධිකරණ ගිණුම් කාර්යාල 24 ක් සහ කම්කරු විනිශ්චය සභා ගිණුම් කාර්යාලයක් හරහා වියදම් බෙදා හැරේ.

## 7.1 ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් 11 දෙනා අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අතර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලැබෙන සියළුම ඉල්ලුම්පත්‍ර එම අධිකරණය විසින් විභාග කරනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට පහත කරුණු සම්බන්ධයෙන් බලය ලබාදෙයි.

- මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය
- අවසාන අභියාචනා අධිකරණ බලය
- උපදේශක අධිකරණ බලය
- මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය
- කවරම ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ බලය
- පාර්ලිමේන්තුව විසින් නිතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණාවක් පිළිබඳ අධිකරණ බලය

ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු සඳහා සහාය දක්වන අතර ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ 234 ශීර්ෂය යටතේ ප්‍රතිපාදන සපයයි. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කාර්යයන් පහත පරිදි වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තා තබා ගැනීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ රැස්වීම් පිළියෙල කිරීම සහ ඉල්ලීම් දින ගත කිරීම.
- අධිකරණ නියෝගයන්ට සහ නඩු තීන්දුවලට අනුකූලව ප්‍රකාශ වාර්තා ගත කිරීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් බඳවා ගැනීම.
- අභියාචනා අධිකරණයෙන් ලැබෙන අභියාචනා නඩුවල පිටපත් සකස් කිරීම නඩු ගාස්තු තක්සේරු කිරීම.

## 2015.01.01 සිට 2015.12.31 දක්වා ප්‍රගතිය

| නඩු වර්ගය | 2015.01.01 දිනට විසඳීමට ඇති සංඛ්‍යාව | 2015.01.01 සිට 2015.12.31 දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2015.01.01-2015.12.31 දක්වා විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව | 2015.01.01-2015.12.31 ඉල්ලීමට ඉඩ ලබාදුන් සංඛ්‍යාව | 2015.01.01-2015.12.31 අවසන් කළ නඩු සංඛ්‍යාව | 2015.12.31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත්‍ර | 738 | 474 | 1212 | 27 | 239 | 946 |
| විශේෂ අවසර ඉල්ලුම්පත්‍ර | 336 | 280 | 616 | - | 85 | 531 |
| පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග | - | 22 | 22 | - | 22 | - |
| අභියාචනා නඩු | 356 | 154 | 510 | - | 109 | 401 |
| වාණිජ මහාධිකරණ අභියාචනා නඩු | 224 | 36 | 260 | - | 50 | 210 |
| මහාධිකරණ අවසර ඉල්ලුම්පත් | 146 | 77 | 223 | 14 | 47 | 162 |
| රිට් ඉල්ලුම්පත්‍ර | 02 | 05 | 07 | - | 02 | 05 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා නඩු | 1176 | 450 | 1626 | 100 | 226 | 1300 |
| ප්‍රතිශෝධන නඩු | 05 | 07 | 12 | - | 01 | 11 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | 01 | - | 01 | - | - | 01 |
| විවිධ නඩු | 09 | 01 | 10 | - | 01 | 09 |
| SC TAB APPEL | - | 01 | 01 | - | - | 01 |
| SC SPECIAL | 13 | - | 13 | - | 01 | 12 |
| එකතුව | 3006 | 1507 | 4513 | 141 | 783 | 3589 |

## 2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (234-01-01)

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 85,740,000 | 76,243,722 |
| ප්‍රාග්ධන වියදම් | 9,500,000 | 4,792,298 |
| එකතුව | 95,240,000 | 81,036,020 |

## 7.2 අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අභියාචනාධිකරණයට මුල් අවස්ථා අධිකරණවල, කම්කරු විනිශ්චය සභාවල සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල තීන්දු සම්බන්ධයෙන් අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ඇත. තවද රිට් ආඥා පිළිබඳ අධිකරණ බලයද සතුය. 2002 අංක 25 දරණ සාපරාධී කරුණු වලදී අන්‍යොන්‍ය සහයෝගීතාව ලබාදීමේ පනත සහ 2000 අංක 39 දරණ සිවිල් සහ වාණිජ කාරණාවලදී අන්‍යොන්‍ය සහයෝගිතාවය ලබාදීමේ පනත්වල සඳහන් කාරණා පිළිබඳ අවශ්‍ය නියෝග හා විධාන ලබාදීමද, මැතිවරණ පෙත්සම් විභාග කිරීමද අභියාචනාධිකරණයෙන් සිදු වන අතර ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ කම්කරු විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක නඩු වාර්තාවක් අධීක්ෂණය කිරීමට හා පරීක්ෂා කිරීමට අභියාචනාධිකරණයට බලය සහ අධිකාරය ඇත.

**2015.01.01 සිට 2015. 12.31 දක්වා නඩු විමසීමේ කාර්ය සාධනය**

| නඩු වර්ගය | 2015.01.01 දිනට විසඳීමට ඇති සංඛ්‍යාව | 2015.01.01-2015.12.31 දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2015.01.01-2015.12.31 දක්වා තීරණයවූ නඩු සංඛ්‍යාව | 2015.12.31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රිට් අයදුම්පත් | 1203 | 561 | 340 | 1424 |
| මහාධිකරණ අභියාචනා (අපරාධ) | 855 | 274 | 254 | 875 |
| (රෙමි) | 02 | - | - | 02 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා | 1117 | 206 | 263 | 1060 |
| සිවිල් අභියාචනා | 981 | - | 208 | 773 |
| පළාත්බද මහාධිකරණ ප්‍රතිශෝධන අයදුම්පත් | 282 | 172 | 143 | 311 |
| ප්‍රතිශෝධන (සිවිල්) සහ අභියාචනයට අවසර ඉල්ලීමේ අයදුම්පත් | 84 | 20 | 40 | 64 |
| වෙනත් අයදුම්පත් | 139 | 80 | 47 | 172 |
| එකතුව | 4663 | 1313 | 1295 | 4681 |

## 2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (234-01-02)

| විස්තරය | ප්‍රතිපාදන(රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 59,760,000 | 53,845,620 |
| ප්‍රාග්ධන වියදම් | 1,500,000 | 1,021,121 |
| එකතුව | 61,260,000 | 54,866,741 |

## 7.3 කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි

කාති උසාවි යනු 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද ලියාපදිංචි කිරීමේ පනත අනුව පිහිටුවනු ලැබූ විශේෂිත අධිකරණයකි. මෙම අධිකරණය විසින් මුස්ලිම් විවාහ සම්බන්ධ අධිකරණ කටයුතු ඔවුන්ගේ සිරිත් වලට අනුව ක්‍රියාත්මක කරනු ලැබේ. ඉස්ලාම් භක්තිකයන් පස් දෙනෙකුගෙන් කාති අභියාචනා මණ්ඩලය සමන්විත වන අතර කාති අධිකරණවල අභියාචනා විභාග කිරිමට ක්‍රියාත්මකවේ. වර්තමානයේ කාති උසාවි 65 ක් සහ එක් කාති අභියාචනා මණ්ඩලයක් ක්‍රියාත්මකවේ.

**කාති උසාවි**

| | | |
|---|---|---|
| අඩ්ඩාලච්චේන | කල්මුණේ | පාතහේවාහැට |
| අක්කරෙයිපත්තුව | කල්පිටිය | පානදුර |
| අකුරණ | කළුතර | පොලොන්නරුව |
| අනුරාධපුරය | මහනුවර | පොතුවිල් (පානම්පත්තුව) |
| අවිස්සාවේල්ල | කාතන්කුඩි (මන්මුනායිපත්තු) | පුල්මුඩේ |
| බදුල්ල | කෑගල්ල | පුත්තලම සහ හලාවත |
| බලපිටිය සහ ඇල්පිටිය | කින්නියා | රත්නපුර |
| බේරුවල | කුලියාපිටිය | සරණාගත ජනසමූහය<br>(කල්පිටිය -පුත්තලම) |
| බෝරා ජනසමූහය | කුරුණෑගල | සායින්දමරුදු |
| බියගම | මහව | සම්මන්තුරෙයි |
| කොළඹ නැගෙනහිර | මන්නාරම | තඹලගමුව සහ කන්තලේ |
| කොළඹ උතුර | මාතලේ | තංගල්ල |
| කොළඹ දකුණ | මාතර | ත්‍රිකුණාමලය |
| කොළඹ බටහිර | මාවනැල්ල | තුම්පනේ |
| එරාවූර් | මෙමොන් ජනසමූහය | ගම්පොල උඩපලාත |
| ගාල්ල | මොණරාගල | උඩතලවින්න (පහත දුම්බර) |
| ගම්පහ (තිහාරිය) | මූතූර් | උඩුනුවර |
| හම්බන්තොට | නාවලපිටිය | වලච්චේන |
| හාරිස්පත්තුව හා පූජාපිටිය | මීගමුව | වවුනියාව |
| හැටන් | නින්දවූර්පත්තු | යටිනුවර |
| හොරණ | නුවර එළිය | යාපනය |
| ඉරක්කාමම් | ඔට්ටමාවඩි | |

## කාති අභියාචනා මණ්ඩලයේ ප්‍රගතිය (2011 – 2015 දක්වා )

| වර්ෂය | මුළු පැමිණිලි සංඛ්‍යාව | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | වර්ෂය අවසානයේ ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| 2011 | 160 | 48 | 112 |
| 2012 | 206 | 69 | 137 |
| 2013 | 219 | 65 | 154 |
| 2014 | 244 | 60 | 184 |
| 2015 | 266 | 112 | 154 |

## කාති උසාවිවල ප්‍රගතිය (2011 – 2015 දක්වා)

| කාලය | මුළු පැමිණිලි සංඛ්‍යාව | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | වර්ෂය අවසානයේ ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| 2011 | 10,554 | 5,786 | 4,768 |
| 2012 | 13,226 | 8,651 | 4,575 |
| 2013 | 12,735 | 7,660 | 5,075 |
| 2014 | 13,479 | 8,479 | 5,005 |
| 2015 | 12,042 | 7,032 | 5,010 |

- වෙල්ලමනල් කාති අධිකරණයේ හා සයින්දමරුදු කාති අධිකරණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

# 08. අනුබද්ධිත ආයතන

## 8.1 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය 1985 අංක 46 දරණ පනත යටතේ පිහිටුවා ඇත. මෙම ආයතනයේ පරිපාලනය කළමනාකරණ මණ්ඩලයක් මගින් සිදුවේ. එහි කළමනාකාරිත්වය අගවිනිසුරුතුමා සහ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන් සැදුම්ලත් සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම ආයතනයට අවශ්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශය මගින් වෙන් කරනු ලැබේ.

ආයතනයේ විෂයයන් හා කාර්යයන්

I. අධිකරණ නිලධාරීන් අතර අධිකරණමය සහ නීතිමය ගැටළු පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැපයීම

II. අධිකරණ නිලධාරීන්ගේ දැනුම, කුසලතාවය, වෘත්තීය අත්දැකීම්, වැඩිදියුණු කිරීමට සාකච්ඡා, දේශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම

III. යුක්තිය පරිපාලනය සම්බන්ධව විවිධ තේමා ඔස්සේ පර්යේෂණාත්මක පාඨමාලාවන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධිකරණ නිලධාරීන්ට පුස්තකාල පහසුකම් සහ වෙනත් අධ්‍යාපනික ආධාරකයන් සැපයීම

## 2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | 22,000,000 | 12,450,000 |
| ප්‍රාග්ධන වියදම | 7,000,000 | 3,910,000 |
| එකතුව | 29,000,000 | 16,360,000 |

## 2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා ප්‍රගතිය

මහාධිකරණ විනිසුරුවරුන්, දිසා විනිසුරුවරුන් මහෙස්ත්‍රාත්වරුන් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සඳහා සෙනසුරාදා දිනවල පහත දැක්වෙන දේශන පවත්වන ලදී.

| පුහුණු වැඩසටහන | වැඩසටහන් ගණන | විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| ඩී.එන්.ඒ විශ්ලේෂණයේදි රජයේ රස පරීක්ෂකයින්ගේ කාර්යභාරය | 02 | 99 |
| 1996 අංක 9 දරණ තනාපති වරප්‍රසාද පනත යටතේ හෙළිදරව් වන ආකාරයට සේවය අවසන් කිරීම | 01 | 31 |
| ප්‍රක්ෂිප්ත විද්‍යා සාක්ෂි | 02 | 79 |
| සැකකටයුතු ලේඛන පරීක්ෂාව | 02 | 79 |
| අන්තර්ජාල හා විද්‍යුත් ගණුදෙනුවල නෛතික හා තාක්ෂණික ගැටළු | 02 | 75 |
| සාගර නීතිය | 01 | 54 |
| බෙදුම් නීතිය පිළිබඳ සම්මන්ත්‍රණය | 10 | 505 |
| කම්කරු විනිශ්චයාධිකාරීවල අභියාචනා සම්බන්ධ නඩු තීන්දු ලිවීම | 01 | 60 |

## විනිශ්චයකාරවරුන් සඳහා පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන | ආයතනයේ නම | විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| පුහුණු පාඨමාලාව | අධිකරණ අධ්‍යාන ආයතනය, දිල්ලි නුවර | 29 |
| පුහුණු පාඨමාලාව | ජාතික අධිකරණ අධ්‍යාන ආයතනය, බෝපාල් නුවර | 90 |
| පුහුණු පාඨමාලාව | අධිකරණ හා නීති පුහුණු ආයතනය, මලයාසියාව | 62 |

1. කාර්ය මණ්ඩලයට රියදුරු 01, ලේකම් 01, දෘඪකාංග හා මෘදුකාංග තාක්ෂණික නිලධාරින් 02, කා.කා.සේ 02 හා ගෘහ පාලක 01 බඳවා ගන්නා ලදී.
2. අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා පුහුණු වැඩමුළු 03ක් පවත්වන ලදී
3. දේශිය හා විදේශිය විනිශ්චයකාරවරුන් 56 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පරිගනක අපරාධ හා ඉලෙක්ට්‍රොනික සාක්ෂි පිළිබඳ වැඩමුළුවක් ටාජ් සමුද්‍රා හෝටලයේදි පවත්වන ලදි.
4. ශ්‍රවණාගාරය සඳහා ශ්‍රව්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සැපයිම.
5. විනිශ්චයකාරවරුන්ගේ ප්‍රයෝජනය සඳහා වන "මනුපුත්‍ර නෛතික දත්ත සංහිතාව" නවීකරණය කිරිම.
6. පුස්තකාලය සඳහා එංගලන්ත නීති වාර්තා ( All England Law Reports) මිලදී ගන්නා ලදි.
7. පහත සඳහන් පරිදි කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම් සිදු කෙරිණි.
   උපදේශකවරුන් 02
   පුස්තකාලයාධිපති 01
8. විනිශ්චයකාරවරුන්ගේ ජර්නලය යාවත්කාලින කිරීම සඳහා කමිටුවක් පත්කරන ලදී.
9. සාක්ෂි නීතිය පිළිබඳ විනිසුරු අත්පොත යාවත්කාලින කිරිම සඳහා කමිටුවක් පත්කරන ලදී.

## 8.2 <u>නීති විද්‍යාලය</u>

**ශ්‍රී ලංකා නීති විද්‍යාලය, නීති අධ්‍යාපනය කළමනාකරණය පිණිස ස්ථාපිත වූ, සංශෝධිත පරිදි 1990 අංක 2 දරන නීති අධ්‍යයන සභා පනත යටතේ ක්‍රියාත්මක වේ. නීති අධ්‍යාපන සභාව ගරු අගවිනිසුරුතුමා (සභාපතිත්වය හොබවන අතර), ගරු නීතිපතිතුමා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකු, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා, ගරු සොලිසිටර් ජනරාල්, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයන් දෙදෙනකුගෙන් සහ අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හය දෙනකුගෙන්ද සමන්විත වෙයි.**

**නීති විද්‍යාලය වසර 3 ක පාඨමාලාවක් පවත්වනු ලැබේ. එක් එක් වසර අවසානයේ සහ අප්‍රේල් මාසයේදී නීති විද්‍යාලය මගින් ප්‍රථම, දෙවන හා තෙවන වසර ශිෂ්‍යයන් සඳහා විභාග පැවැත්වේ. මෙම විභාගයන්ගෙන් සමත්වන ශිෂ්‍යයන් අවුරුදු 08 ක අවම පළපුරුද්ද සහිත ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු යටතේ මාස 06 ක ආධුනිකත්ව පුහුණුව ලබා ගැනීම අවශ්‍ය වෙයි.**

**මෙම ආයතනය ස්වයංමූල්‍ය සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වේ. නීතිඥ වෘත්තියේ යෙදී සිටින සහ නීතිඥයන් වශයෙන් ආයතනයන්හි සේවය කරන බාහිර කථිකාචාර්යවරුන් විසින් දේශන පවත්වනු ලබන අතර ඔවුන් ජනාධිපති නීතිඥවරුන් හෝ ඉහල අධ්‍යාපනික සුදුසුකම් සහ අත්දැකීම් වලින් පරිපූර්ණ නීතිඥවරුන් වේ.**

**<u>2015-01-01 සිට 2015-12-31 දක්වා ප්‍රගතිය</u>**

**2015 අප්‍රේල් සහ 2015 ඔක්තෝම්බර් විභාග සඳහා පෙනී සිටි සිසුන් ගණන පිළිවෙලින් 1008 හා 2201 කි.**

**2015-01-01 දින සිට 2015-12-31 තෙක් කාලයට නීති ශිෂ්‍යයන් නීති ප්‍රවේශ විභාගයෙන් සමත්වූවන් සහ දේශීය හා විදේශීය එල්.එල්.බී. උපාධිධාරීන් 1036 නීති විද්‍යාලයට ඇතුලත් වී ඇත.**

**2015-09-26 දින පැවැත්වූ නීති විද්‍යාල ප්‍රවේශ විභාගයෙන් අයදුම්කරුවන් 4718 ක් අතරින් 2016 වර්ෂය සඳහා අවශ්‍යතා සපුරාලමින් සමත්වූ 213 දෙනෙකු ශිෂ්‍යයන් ලෙස ලියාපදිංචි කරවා ගෙන ඇත.**